# මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 10 දරණ සමුපකාර සමිති ප්‍රඥප්තිය

(1992 අගෝස්තු 17 දින මධ්‍යම පළාතේ
ගරු ආණ්ඩුකාර තුමාගේ අනුමැතිය ලැබීත)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අංක 751
දරණ 1993 ජනවාරි 22 දිනැති ගැසට් පත්‍රයේ IV (අ)
කොටසේ අතිරේකයක් වශයෙන් පලකරන ලදි

මගේ අංකය : මපස/ඒ/12/90 (viii).

## මධ්‍යම පළාත් සභාව

මතු දක්වෙන ප්‍රඥප්තිය 1992ක් වූ මැයි මස 06 වැනි දින පැවැති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේ දී ඒකමතිකව සභා සම්මත වූ අතර ; මධ්‍යම පළාතේ ගරු ආණ්ඩුකාරතුමාගේ අංක ජීසීපී/ඒඑස්/3 හා 1992ක් වූ අගෝස්තු මස 17 වැනි දින දරන ලිපියෙන් එයට අනුමැතිය ලැබී ඇති බව මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,<br>
සභා ලේකම්,<br>
මධ්‍යම පළාත් සභාව.

1992 නොවැම්බර් මස 06 වැනි දින,<br>
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,<br>
තැ. පෙ. 92,<br>
පල්ලේකැලේ,<br>
කුණ්ඩසාලේ.

## මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය

*සමූපකාර සමිති සංවර්ධනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, සමූපකාර සමිති පිහිටුවීම ලියාපදිංචි කිරීමට හා පාලනය අදාළ නීතිය ඒකාබද්ධ කිරීම හා සංශෝධනය කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ ප්‍රඥප්තියකි මෙම ප්‍රඥප්තිය 1972 අංක 05 දරන සමූපකාර සමිති පනත හා නොපැසදේ (INCONSISTANT).*

කෙටි නාමය.

01. මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 10 දරන සමූපකාර සමිති ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

### I වැනි ඡේදය
### *ලියාපදිංචි කිරීම*

රෙජිස්ට්‍රාර්, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හා සහකාර රෙජිස්ට්‍රාර්වරුන් පත්කිරීම හා සමූපකාර සංවර්ධන කොමසාරිස්ගේ හා ඒ කොමසාරිස්ට සහායවීම සඳහා පත් කරන ලද තැනැත්තාගේ බලතල.

02. (1) ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාත සඳහා සමූපකාර සමිති රෙජිස්ට්‍රාර්වරයෙකු හා අවශ්‍ය විය හැකි යම් නියෝජ්‍ය ජ්‍යෙෂ්ඨ සහකාර, හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරුන් ගණනක් පත් කරනු ලැබිය හැකිය.

(2) මේ ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදනු ලැබූ යම් රීති යටතේ රෙජිස්ට්‍රාර්වරයෙකු සතු සියළුම බලතල හෝ ඉන් යමක් යම් නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර හෝ සහකාර රෙජිස්ට්‍රාර්වරයෙකු වෙත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමූපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මගින් පැවරිය හැකිය.

(3) සමූපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් හෝ සමූපකාර සංවර්ධන කොමසාරිස් වශයෙන් තත් කාලයෙහි ක්‍රියා කිරීමට පත් කරනු ලබන තැනැත්තාට මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදනු ලැබූ හෝ ලැබ ඇතැයි සැලකෙන යම් රීතිවලින් සමූපකාර සමිති රෙජිස්ට්‍රාර් වෙත පවරනු ලැබූ බලතලම තිබිය යුතු අතර ඔහු විසින් ඒ බලතල ක්‍රියාවෙහි යෙදවිය හැකිය.

(4) සමූපකාර සංවර්ධන කොමසාරිස්ට සහායවීම පිණිස පත් කරනු ලබන එක් එක් තැනැත්තාට මේ ප්‍රඥප්තිය යටතේ හා ඒ යටතේ සාදනු ලැබූ හෝ සාදනු ලැබ ඇතැයි සැලකෙන යම් රීති යටතේ රෙජිස්ට්‍රාර් සතු බලතල අතුරින් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමූපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් මේ වගන්ති යටතේ කරනු ලබන යම් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි බලතල තිබිය යුතු අතර ඒ එක් එක් තැනැත්තා විසින් ඒ බලතල ක්‍රියාත්මක කළ හැකිය.

ලියාපදිංචි කරනු ලැබිය හැකි සමිති.

03. (1) මෙහි මින්මතු අඩංගු කරනු ලබන විධිවිධානවලට යටත්ව –

(අ) සමිතියේ සාමාජිකයන්ගේ ආර්ථික, සමාජයීය, හෝ සංස්කෘතික ආයත්තතා සමූපකාර ප්‍රතිපත්ති අනුව දියුණු කිරීම සමිතියේ අරමුණ වශයෙන් ඇති සමිතියක් ; හෝ

(ආ) (අ) ඡේදයෙහි සඳහන් සමිතියක කටයුතු පහසු කිරීමේ අරමුණ ඇතිව පිහිටුවන ලද සමිතියක් ; හෝ

(ඇ) සමූපකාර අධ්‍යාපනය හා පුහුණුව දීමේ හා මධ්‍යම පළාතේ සමූපකාර සමිතිවලට උපදේශක සේවාවන් හා මධ්‍යම පළාතේ සමූපකාර ව්‍යාපාරය දියුණු කිරීම පිණිස වෙනත් සේවාවන් සැලැස්වීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ලියාපදිංචි සමිති සාමාජිකයන් වශයෙන් ඇති සමිතියක් ; හෝ

(ඈ) අලෙවි කිරීමෙහි, කර්මාන්තයෙහි, කෘෂිකර්මාන්තයෙහි, ධීවර කර්මාන්තයෙහි හෝ රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලැබිය හැකි අන් කටයුත්තක නියුක්ත, සමූපකාර සමිතිවල කටයුතු සැලසුම් කිරීමේ, ඒකාබද්ධ කිරීමේ හා පහසු කිරීමේ කාර්යය සඳහා පිහිටුවන ලද ලියාපදිංචි කළ සමිති සාමාජිකයන් වශයෙන් ඇති සමිතියක්,

සීමාසහිත වගකීම් ඇතිව හෝ නැතිව මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

එසේ වුවද, ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් සාමාජිකයෙකු වන සමිතියක වගකීම සීමා කරනු ලැබිය යුතුය.

(2) සමිතියක සාමාජිකයන්ගේ වගකීම සීමා කරනු ලැබූ අවස්ථාවක ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් නොවන කිසිම සාමාජිකයෙකු විසින් ; පහත් ඒකක උපරිම ප්‍රමාණයකට යටත්ව, ඒ සමිතියේ කොටස් ප්‍රාග්ධනයේ රීතිවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට වැඩි ප්‍රමාණයක් නො දැරිය යුතුය.

ලියාපදිංචි කිරී
කොන්දේ

04. (1) ලියාපදිංචි කරනු ලැබූ සමිතියක සාමාජිකයෙකු වන සමිතියක් හැර, එක් එක් තැනැත්තා වයස අවුරුදු දහ අටට වැඩි, හා ලියාපදිංචි කිරීම අපේක්ෂා කරන සමිතියේ කටයුතු කරගෙන යාමට යෝජනාකර ඇති ප්‍රදේශය ඇතුළත පදිංචිව සිටින හෝ සේවයේ යොදවනු ලැබ සිටින හෝ නිශ්චල දේපළක් අයිතිව සිටින තැනැත්තන් යටත් පිරිසෙයින් දස දෙනෙකුගෙන් සමන්විත නොවන කිසිම සමිතියක් මේ පනත යටතේ ලියාපදිංචි කරනු නො ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යයන් සඳහා යම් තැනැත්තෙකුගේ වයස, පදිංචිය, රක්ෂාව හෝ දේපළ සුදුසුකම් සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් පැන නගින අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සීමාසහිත වගකීම්වලින් යුතු සෑම සමිතියකම නාමෙහි "සීමාසහිත" යන වචනය මුල් වචනය විය යුතු ය. එහි දෙමළ හෝ ඉංග්‍රීසි සමාන වචනය ඒ නාමේ කොටසක් විය යුතුය.

ලියාපදිංචි කිරී
සඳහා ඉල්ලුම් 

05. (1) ලියාපදිංචි කිරීමේ කාර්යය සඳහා ඉල්ලුම් පත්‍රයක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතුය.

(2) ඒ ඉල්ලුම් පත්‍රය –

(අ) කිසිම සාමාජිකයකු ලියාපදිංචි කරනු ලැබූ සමිතියක් නොවන සමිතියක් සම්බන්ධයෙන් වූ විට 4(1) වැනි වගන්තියේ නියමයන් අනුව සුදුසුකම් ලත් තැනැත්තන් යටත් පිරිසෙයින් දස දෙනෙකු විසින් අත්සන් කරනු ලැබිය යුතුය ; තවද

(ආ) ලියාපදිංචි කළ සමිතියක් සාමාජිකයකු වන සමිතියක් සම්බන්ධයෙන් වූ විට ලියාපදිංචි කළ එවැනි සෑම සමිතියක් වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ තැනැත්තකු විසින් සහ සමිතියේ සියලුම සාමාජිකයන් ලියාපදිංචි කළ සමිති නොවන අවස්ථාවක වෙනත් සාමාජිකයන් දස දෙනෙකු විසින් හෝ වෙනත් සාමාජිකයන් ගණන දහයට වඩා අඩු වන අවස්ථාවක ඒ සාමාජිකයන් සියලු දෙනා විසින් අත්සන් කරනු ලැබිය යුතුය.

(3) සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථාවල පිටපත් දෙකක් ඉල්ලුම් පත්‍රය සමග එවිය යුතු අතර ඒ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරනු ලබන්නේ යම් තැනැත්තන් විසින් ද නැතහොත් යම් තැනැත්තන් වෙනුවෙන් ද ඒ තැනැත්තන් විසින්, ඒ සමිතිය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ට අවශ්‍ය විය හැකි යම් තොරතුරු සැපයිය යුතු ය.

ලියාපදිංචි කිරී

06. සමිතියක් විසින් මේ ප්‍රඥප්තිය හා රීතිවල විධිවිධාන අනුව ක්‍රියාකර ඇති බවට, ඒ සමිතිය නියුක්තවීමට අදහස් කරන කටයුතු ආර්ථික වශයෙන් සත්‍ය බවට, හා සමිතියේ යෝජිත අතුරු ව්‍යවස්ථා මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර් සෑහීමට පත්වන්නේ නම්, තමා සුදුසු යයි සලකනහොත් ඔහු විසින් ඒ සමිතිය හා එහි අතුරු ව්‍යවස්ථා ලියාපදිංචි කළ හැකිය. යම් සමිතියක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ආයාචනයක්, ඒ සම්බන්ධයෙන් සාදනු ලැබූ රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතුය.

ලියාපදිංචි කිරීම

07. රෙජිස්ට්‍රාර් විසින් අත්සන් කරනු ලැබූ ලියාපදිංචි කිරීමේ සහතිකයක්, ඒ සහතිකයෙහි සඳහන් සමිතියෙහි ලියාපදිංචි කිරීම අවලංගුකර ඇති බව ඔප්පු කරනහොත් මිස, ඒ සමිතිය යථා පරිදි ලියාපදිංචි කරනු ලැබූ බවට තීරණාත්මක සාක්ෂිය විය යුතුය.

ලියාපදිංචි කළ
සමිතියක අතුරු
ව්‍යවස්ථා
සංශෝධනය කි

08. (1) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ ප්‍රඥප්තියට හා ඒ යටතේ සාදනු ලැබූ රීතිවලට යටත් ව සමිතියේ නම ප්‍රකාශ කරන අතුරු ව්‍යවස්ථාව ඇතුළු සමිතියේ අතුරු ව්‍යවස්ථා සංශෝධනය කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක කිසිම අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ඒ සංශෝධනය මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලබන තෙක් වලංගු නො විය යුතු ය. ඒ කාර්යය සඳහා ඒ සංශෝධනයේ පිටපත් දෙකක් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) අතුරු ව්‍යවස්ථාවල යම් සංශෝධනයක් මේ ප්‍රඥප්තියට හෝ රීතිවලට පටහැනි නොවන බවට රෙජිස්ට්‍රාර් සෑහීමකට පත්වන්නේ නම්, තමා සුදුසු යයි සලකනහොත් ඔහු විසින් ඒ සංශෝධනය ලියාපදිංචි කළ හැකිය. යම් අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් ලියාපදිංචි කිරීම රෙජිස්ට්‍රාර් විසින් ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ආයාචනයක් ඒ සම්බන්ධයෙන් සාදනු ලැබිය හැකි යම් රීති අනුව අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ හැකි විය යුතු ය.

(4) සමිතියක නාමයක් වෙනස් කරන සංශෝධනයක් ඒ සමිතියේ හෝ එහි යම් සාමාජිකයන්ගේ හෝ හිටපු සාමාජිකයන්ගේ යම් අයිතිවාසිකමක් හෝ බැඳීමක් කෙරෙහි බල නො පෑ යුතු අතර, එවකට පවත්නා යම් නීති කෘත්‍යයක් එහි අලුත් නාමය යටතේ ඒ සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරියටත් පවත්වාගෙන යනු ලැබිය හැකි ය.

(5) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථා සංශෝධනයක් රෙජිස්ට්‍රාර් විසින් ලියාපදිංචි කරනු ලබන අවස්ථාවක තමා විසින් සහතික කරන ලද ඒ සංශෝධනයේ පිටපතක් ඔහු විසින් සමිතිය වෙත නිකුත් කළ යුතුය. ඒ සංශෝධනය යථා පරිදි ලියාපදිංචි කර ඇති බවට ඒ සංශෝධනය සහතික කරනු ලැබූ පිටපත තීරණාත්මක සාක්ෂිය විය යුතු ය.

(6) මේ වගන්තියෙහි "සංශෝධනය" යන්නට අලුත් අතුරු ව්‍යවස්ථාවක් සෑදීම හා අතුරු ව්‍යවස්ථාවක් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම ඇතුළත් වේ.

ලියාපදිංචි කළ සමිතිවල වත්කම් හා බැරකම් ඒකාබද්ධ කිරීම බෙදීම හා පැවරීම.

09. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව හා ඒ සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් -

(අ) සමිතියේ වත්කම් හා බැරකම් සම්පූර්ණයෙන් ම හෝ ඉන් යම් කොටසක් යම් ලියාපදිංචි කරනු ලැබූ අන් කිසි සමිතියකට පැවරීම ; හෝ

(ආ) සමිතිය සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් වශයෙන් බෙද වෙන්කර ගැනීම ;

කළ හැකිය.

(2) යම් ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් විසින්, කලින් ලබාගත් රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය ඇතිව හා ඒ එක් එක් සමිතියේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් හෝ නියෝජිතයන්ගෙන් තුනෙන් දෙකක වැඩි සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනාවකින් ඒකාබද්ධව අලුත් සමිතියක් පිහිටුවා ගත හැකිය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වැනි උප වගන්තිය හෝ (2) වැනි උප වගන්තිය යටතේ සම්මතකර ගනු ලබන යෝජනාවක අවස්ථාවෝචිත පරිදි පැවරීම, බෙද වෙන්කර ගැනීම හෝ ඒකාබද්ධ කිරීම පිළිබඳ සියලු විස්තර අඩංගු විය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක් විසින් එවැනි යම් යෝජනාවක් සම්මතකර ගනු ලැබූ අවස්ථාවක, ඒ සමිතිය විසින් සමිතියේ සියලු සාමාජිකයන් හා ණය හිමියන් වෙත ලිඛිත දැන්වීමක් කළ යුතු අතර, පවතින අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුමක් ඇත ද එය නොතකා යම් සාමාජිකයෙකු හෝ ණය හිමියකු වෙත ඒ දැන්වීම භාරදීමේ දිනයෙන් පසු එක් මාසයක කාලය තුළ අවස්ථාවෝචිත පරිදි තම කොටස්, තැන්පතු හෝ ණය මුදල් ඉල්ලා අස්කර ගැනීමට තෝරා ගැනීමේ බලය ඒ සාමාජිකයාට හෝ ණය හිමියාට තිබිය යුතුය.

(5) (4) වැනි උප වගන්තියෙහි නිශ්චිතව සඳහන් කාල සීමාව ඇතුළත තම තෝරා ගැනීමේ බලය ක්‍රියාවෙහි නො යොදවන යම් සාමාජිකයෙකු හෝ ණය හිමියකු විසින් යෝජනාවෙහි අඩංගු කරුණුවලට කැමැත්ත දක්වනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(6) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ වගන්තිය යටතේ සම්මතකරගත් යෝජනාවකට යම් වත්කම් හා බැරකම් පැවරීමක් ඇතුළත්වන අවස්ථාවක, තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොතකා ඒ සම්මතකර ගත් යෝජනාව තව දුරටත් තහවුරු කිරීමක් නොමැතිව පැවරීම්ලාභීන් වෙත ඒ වත්කම් හා බැරකම් සතු කිරීමේ ප්‍රමාණවත් පැවරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය.

ඇතැම් අවස්ථාවල දී ලියාපදිංචි කළ සමිතිවල ලියාපදිංචි කිරීම් සහතික අවලංගු කිරීම.

10. (1) ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා බැරකම් සියල්ලම වෙනත් ලියාපදිංචි කළ සමිතියකට 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව පවරනු ලැබූ අවස්ථාවක, පළමුව සඳහන් වූ සමිතියේ ලියා පදිංචි කිරීම අවලංගු විය යුතු අතර ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසාන් විය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිති දෙකක් හෝ ඊට වැඩි ගණනක් 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව අලුත් සමිතියක් වශයෙන් ඒකාබද්ධ කරනු ලැබූ අවස්ථාවක ඒකාබද්ධ කරනු ලැබූ ඒ එක් එක් සමිතියේ ලියාපදිංචි කිරීම අලුත් සමිතිය ලියාපදිංචි කරනු ලැබූ දිනයෙහි අවලංගු විය යුතු අතර ඒ එක් එක් සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතු ය.

(3) ලියාපදිංචි කළ සමිතියක් 9 වැනි වගන්තියේ විධිවිධාන අනුව සමිති දෙකකට හෝ වැඩි ගණනකට වෙන් ව බෙදී යන අවස්ථාවක ඒ සමිතියේ ලියාපදිංචි කිරීම අලුත් සමිති ලියාපදිංචි කිරීමෙන් පසු අවලංගු විය යුතු අතර ඒ සමිතිය විසුරුවා හරිනු ලැබ ඇති ලෙස සලකනු ලැබිය යුතුවාක් මෙන්ම සංස්ථාවක් වශයෙන් පැවතීම ද අවසන් විය යුතුය.

## II වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කරනු ලැබූ සමිතිවල සාමාජිකයන් සහ ඔවුන්ගේ අයිතිවාසිකම් හා වගකීම්*

අය විය යුතු ගෙවීම් කරනු ලබන තෙක් සාමාජිකයන් විසින් අයිතිවාසිකම් පාවිච්චි නොකළ යුතු බව.

11. (1) සාමාජිකත්වය සම්බන්ධයෙන් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි යම් ගෙවීමක් තමා විසින් කරනු ලැබ ඇත්නම් මිස හෝ කරනු ලබන තෙක් නැතහොත් සමිතියෙහි එසේ නියම කරනු ලැබිය හැකි යම් සම්බන්ධතාවක් අත්කර ගනු ලැබ ඇත්නම් මිස හෝ අත්කරගනු ලබන තෙක් ලියාපදිංචි කළ සමිතියක කිසිම සාමාජිකයකු විසින් සාමාජිකයෙකුගේ අයිතිවාසිකම පාවිච්චි නොකළ යුතු ය.

(2) සමිතිය වෙත (1) වැනි උප වගන්තියෙහි සඳහන් යම් ගෙවීමක් කරනු ලැබ නැති හෝ ඒ සමිතියෙහි ඒ උප වගන්තියෙහි සඳහන් යම් සම්බන්ධතාවක් අත්කරගෙන නැති අවස්ථාවක ඒ සාමාජිකයාගෙන් (1) වැනි උප වගන්තියේ සඳහන් ඒ ගෙවීම හෝ ඒ සම්බන්ධතාව සම්බන්ධයෙන් අය විය යුතු මුදලක් 1961 අංක 33 දරන කෘෂිකාර්මික නිෂ්පාදන (සහතික මිල හා පැකීම හා සෙවීම පාලනය කිරීමේ) පනත යටතේ යම් උපලේඛනගත කෘෂි කාර්මික නිෂ්පාදනයක් මිලට ගැනීම සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට සමිතියෙන් ගෙවිය යුතු යම් මුදලකින් සමිතිය විසින් අඩුකර ගැනීම නීත්‍යානුකූල විය යුතුය.

ආශ්‍රිත සාමාජිකයන්

12. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් කවර පුද්ගලයෙකු වුවද ආශ්‍රිත සාමාජිකයෙකු වශයෙන් ඇතුළත්කර ගත හැකි ය.

(2) ආශ්‍රිත සාමාජිකයෙකුට සමිතියේ වත්කම්වල හෝ ලාභවල කවර ආකාරයේ හෝ කොටසකට හෝ සමිතියේ කටයුතු කරගෙන යාමෙහිලා යම් ඡන්ද බලයකට හිමිකම් නොලැබිය යුතුය.

බාල වයස්කරුවන් වන සාමාජිකයින් විසින් සමිති සමග ඇතිකර ගනු ලබන ගිවිසුම.

13. යම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වශයෙන් යථා පරිදි ඇතුළත්කර ගනු ලැබූ යම් තැනැත්තකුගේ බාල වයස හෝ ඔහු නිසි වයසට නොපැමිණීම මේ ප්‍රඥප්තිය යටතේ හෝ මේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති යටතේ ඔහු විසින් ලියා අත්සන් කරනු ලැබීම අවශ්‍ය නීත්‍යානුකූල ලේඛනයක් ලියා අත්සන් කිරීමට හෝ දෙනු ලැබීම අවශ්‍ය නිදහස් කිරීමක් වීමට ඔහුට බාධාවක් නොවිය යුතුය. තවද එවැනි යම් තැනැත්තකු විසින් සමිතියක් සමඟ ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම සඳහා හෝ මඟ හරිනු පිණිස ඒ කරුණු හේතුවක් නොවිය යුතුය.

එමෙන්ම එවැනි යම් තැනැත්තෙකු විසින් ප්‍රධාන පාර්ශවකරුවකු හෝ ඇපකරුවෙකු වශයෙන් සමිතියක් සමඟ ඇතිකරගත් එවැනි යම් ගිවිසුමක් ඔහුගේ බාල වයසට හෝ නිසි වයසට නොපැමිණීම නොතකා ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව නීතිය අනුව ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

සමිතිවල නිලධරයා විසින් ඇති කර ගනු ලබන ගිවිසුම්

14. ලියාපදිංචි කළ සමිතියක යම් නිලධාරියෙකු පත්කිරීමෙහි ලා වූ යම් දෝෂයක් හෝ ඔහු තෝරාපත් කර ගැනීම සඳහා වූ යම් නුසුදුසුකමක් කදන්තරව සොයා ගැනීම ඒ සමිතිය වෙනුවෙන් ඒ නිලධාරියා විසින් ඇතිකර ගනු ලැබූ යම් ගිවිසුමක් අවලංගු කිරීම හෝ මඟහැරීම සඳහා හේතුවක් නොවිය යුතුය.

සාමාජිකයින්ගේ ඡන්ද

15. යම් මූලික සමිතියක සාමාජිකයෙකුට සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහි ලා එක් ඡන්දයකට වැඩියෙන් නොතිබිය යුතුය.

එසේ වුවද ඡන්ද සම සමව බෙදුනහොත් සභාපතිට තීරක ඡන්දයක් තිබිය යුතු ය.

ඡන්ද පාවිච්චි කිරීමේ ආකාරය.

16. (1) යම් මූලික සමිතියක සාමාජිකයෙකු විසින් ඒ සමිතියේ යම් රැස්වීමක දී පෞද්ගලිකවම හැර තම ඡන්දය පාවිච්චි නොකළ යුතුය.

එසේ වුවද, නියෝජිතයන් මාර්ගයෙන් ඡන්දය දීමට සමිතියේ අතුරු ව්‍යවස්ථා යටතේ විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක සමිතියේ යම් රැස්වීමක දී එසේ ඡන්දය දීමට ඉඩදිය හැකිය.

(2) වෙනයම් ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු වන ලියා පදිංචි කළ සමිතියක් විසින් ඒ වෙනයම් ලියාපදිංචි කළ සමිතියේ කටයුතු පවත්වාගෙන යාමෙහි ලා ඡන්දය දීමේ කාර්යය සඳහා ස්වකීය සාමාජිකයන්ගෙන් කෙනෙකු හෝ වැඩි ගනණක් පත්කළ හැකිය.

කොටස් හෝ සම්බන්ධතා පැවරීම පිළිබඳ සීමා.

17. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකුගේ හෝ සිටිය සාමාජිකයෙකුගේ හෝ මියගිය සාමාජිකයෙකුගේ හෝ ප්‍රාග්ධනයෙන් කොටස් හෝ වෙනත් සම්බන්ධතා පැවරීම, සතුව සිටිය හැකි වැඩිම ප්‍රමාණය සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියෙන් හෝ රීතිවලින් නියම කරනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව විය යුතුය.

(2) සීමා රහිත වගකීම්වලින් යුත් ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට, කිසිම සාමාජිකයෙකු විසින්-

(අ) තමා විසින් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් එක් අවුරුද්දකට නොඅඩු කාලයක් දරන ලද්දේ නම් ; හා

(ආ) සමිතිය වෙත හෝ සමිතියේ සාමාජිකයෙකු වෙත හෝ සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රය කාරක සභාව විසින් පිළිගනු ලැබ සිටින තැනැත්තෙකු වෙත පැවරීම කරනු ලබන්නේ නම්,

මිස තමා විසින් දරනු ලබන සමිතියේ ප්‍රාග්ධනයෙන් යම් කොටසක් හෝ සම්බන්ධතාවක් හෝ එහි යම් කොටසක් නො පැවරිය යුතු ය.

## III වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතිවල යුතුකම්.*

සමිති ලිපිනය.

18. දැන්වීම් හා ලිපි යවනු ලැබිය හැකි, රීති අනුව ලියාපදිංචි කරනු ලැබූ ලිපිනයක් සෑම ලියාපදිංචි කළ සමිතියකටම එවිය යුතු අතර, ඒ ලිපිනය සම්බන්ධයෙන් යම් වෙනසක් ඇති වීමෙන් පසු දින හතක් (07) ඇතුළත ඒ වෙනස රෙජිස්ට්‍රාර් වෙත දැන්විය යුතුය.

ප්‍රඥප්තිය, රීති, ව්‍යවස්ථා යනාදියේ පිටපතක් පරීක්ෂා කර බැලීමට විවෘතව තිබිය යුතු බව.

19. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක් මවිසින් මේ ප්‍රඥප්තියේ රීතිවල හා සමිතියේ අතුරු ව්‍යවස්ථාවල පිටපත් 05 ක් ද සමිතියේ හා සාමාජිකයන්ගේ නාම ලේඛනයක් ද ගාස්තු ගෙවීමක් නොමැතිව සියළු යුක්තිසහගත වේලාවලදී පරීක්ෂා කර බැලීම සඳහා සමිතියේ ලියාපදිංචි කරන ලද ලිපිනය දරන ස්ථානයෙහි තැබිය යුතුය.

(2) මෙම ලේඛනයේ පහත සඳහන් තොරතුරු ඇතුළත් විය යුතුය :-

(අ) සෑම සාමාජිකයාගේම නම, ලිපිනය සහ රැකියාව ;
(ආ) සාමාජිකයෙකු වශයෙන් ලේඛනගත කරන ලද දිනය ;
(ඇ) සාමාජිකත්වය අහිමි වූ දිනය ;
(ඈ) සාමාජිකත්වය අහිමිවීමට හේතු වූ කරුණු.

## IV වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිති සතු වරප්‍රසාද*

සමිති සංස්ථාගත බව.

20. සමිතියක් ලියාපදිංචි කිරීම හේතුකොට ගෙන, එය ලියාපදිංචි කරනු ලැබූ නාමය යටතේ, අවිච්ඡින්න පරම්පරාවක් හා පොදු මුද්‍රාවක් ඇති හා දේපල සතුව තිබීමේ ද ගිවිසුම්වලට ඇතුළත් වීමේ ද නඩු හා වෙනත් නීති කෘත්‍ය පැවරීමේ හා ඒවා සම්බන්ධයෙන් තිදහසට හරුණු කීමේ ද සමිතිය පිහිටුවීමේ කාර්යය සඳහා අවශ්‍ය සියළු දේවල් කිරීමේ ද බලය සහිත සංස්ථාවක් විය යුතුය.

සමිතිය හෝ සමිතිය මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීම.

21 (1) කෘෂිකාර්මික හෝ සත්ව පාලනමය ද්‍රව්‍ය හෝ යම් කර්මාන්තයක නිෂ්පාදනය වන යම් භාණ්ඩයක් විකිණීම එක් පරමාර්ථයක් වශයෙන් ඇති ලියාපදිංචි කළ සමිතියක් විසින් -

(අ) එවැනි යම් දෙයක් නිෂ්පාදනය කරන සමිතියේ සෑම සාමාජිකයෙකුවිසින් ඒ ද්‍රව්‍ය සම්පූර්ණයෙන් හෝ එහි යම් නිශ්චිත කොටසක්, සමානුපාතයක් හෝ වර්ගයක් සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකිණිය යුතු බවට ; හා

(ආ) අතුරු ව්‍යවස්ථා හෝ ගිවිසුම් කඩ කිරීමේ වරදට වරදකරු ලෙස රීතිවලින් නියම කළ හැකි ආකාරයෙන් ඔප්පු කරනු ලැබූ හෝ තීන්දු කරනු ලැබූ සාමාජිකයෙකු විසින් රීති වලින් හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථා වලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් නිශ්චය කරනු ලබන හෝ තක්සේරු කරනු ලබන මුදලක් ප්‍රමාණ කළ අලාභය වශයෙන් සමිතියට ගෙවිය යුතු බවට ;

සමිතියේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන සැලැස්වීම හෝ එහි සාමාජිකයන් සමඟ ගිවිසුමකට ඇතුළත්වීම කළ හැකිය.

(2) ලියාපදිංචි කළ සමිතියක් විසින් (1) වැනි උප වගන්තිය යටතේ ඇති කරගත් ගිවිසුමකින් ඒ ගිවිසුමට අදාළ වන, නිෂ්පාදිත හෝ නිෂ්පාදනය කරනු ලැබීමට ආසන්න සියළු ද්‍රව්‍යයන් කෙරෙහි සමිතියේ වාසියට පළමු බැඳීමක් ඇතිවිය යුතුය.

(3) (1) වැනි උප වගන්තිය යටතේ වූ ගිවිසුමකින් උද්ගතවන යම් නීති කෘත්‍යයක දි ඒ ගිවිසුම ව්‍යාපාර තහනමක් වශයෙන් වූ ගිවිසුමක් යන්න නිදහසට කරුණක් නොවිය යුතුය.

(4) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයකු වීමට පෙර තම ද්‍රව්‍ය වෙනයම් තැනැත්තෙකුට භාරදීමට ගිවිසගෙන සිටීමේ හේතුව කරන කොටගෙන ඒ ද්‍රව්‍ය ලියාපදිංචි කළ සමිතියට භාරදීමට ඔහු අපොහොසත් වුවේ නම් ඒ නිෂ්පාදන සමිතියට භාරදීමට තමාට නියම කෙරෙන ඒ සමිතියේ යම් අතුරු ව්‍යවස්ථාවක් ඒ සාමාජිකයා විසින් කඩ කරනු ලැබූ ලෙස නොසැලකිය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කරන සෑම තැනැත්තෙකුම විසින්, යම් ද්‍රව්‍යයක් වෙනයම් තැනැත්තෙකුට භාරදීම සඳහා තමා ඇතිකරගත් සියළු ගිවිසුම් පිළිබඳ විස්තර තම ඉල්ලුම්පත්‍රයෙහි එළිදරව් කරන ලෙස නියම කරනු ලැබුවහොත් එසේ කළ යුතුය.

ඇතැම් අවස්ථාවල දී ලියාපදිංචි කළ සමිතියක් මාර්ගයෙන් නිෂ්පාදන අනිවාර්යයෙන් විකිණීම.

(22) (1) ලියාපදිංචි කළ යම් සමිතියක් සම්බන්ධයෙන් වූ විට ඒ සමිතියේ සාමාජිකයන් හෝ එහි යම් කොටසක් මධ්‍යම පළාතේ එහි යම් දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක යම් භාණ්ඩයක් නිපදවන්නන් බවට අමාත්‍යවරයා සෑහීමට පත්වන අවස්ථාවක මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් තමාගේ අභිමතය පරිදි මධ්‍යම පළාතෙහි හෝ එහි යම් දිස්ත්‍රික්කයක හෝ ප්‍රදේශයක, ඒ භාණ්ඩය පිළිබඳ එක් එක් නිපදවන්නාට ඒ නිපදවන්නා ඒ සමිතියේ සාමාජිකයෙකු වුවද නොවුවද ඒ නිපදවන්නා විසින් නිෂ්පාදනය කරනු ලබන ඒ භාණ්ඩයෙහි සම්පූර්ණ ප්‍රමාණයෙන් ඔහුගේම ප්‍රයෝජනයට හෝ පාරිභෝජනයට අවශ්‍ය නොවන කොටස් ඒ සමිතියට හෝ සමිතිය මාර්ගයෙන් විකුණන ලෙස විධාන කළ හැකිය.

(2) මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් (1) වැනි උපවගන්තිය යටතේ කරනු ලැබූ සෑම ආඥාවක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාවෙහි ඒ භාණ්ඩය ආඥාව ක්‍රියාත්මක විය යුතු ප්‍රදේශය හා ඒ භාණ්ඩ නිපදවන්නාට ගෙවිය යුත්තේ කවර පදනමක් මත ද යන වග නිශ්චිතව සඳහන් කළ යුතුය.

(3) සෑම ආඥාවක් එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින ක්‍රියාත්මක විය යුතු අතර (5) වැනි උප වගන්තියේ විධිවිධාන වලට යටත්ව එය පරිච්ඡින්න කරනු ලබන තෙක් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(4) සෑම ආඥාවක්ම ක්‍රියාත්මකවීමෙන් පසු හැකි ඉක්මනින් අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

(5) මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන සෑම ආඥාවක්ම පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සළකනු ලැබිය යුතු අතර එය යටතේ කලින් කරන ලද හෝ කරනු ලැබීමට ඉඩදෙන ලද කිසිවක වලංගුභාවයට හානිකර නොවිය යුතුය. ආඥාවක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකෙන දිනය ඒ ආඥාව අනුමත කිරීම මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් ප්‍රතික්ෂේප කරනු ලබන දිනය විය යුතු අතර ඒ දිනය ගැසට් පත්‍රයෙහි නිවේදනය කරනු ලැබිය යුතුය.

(6) (අ) මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපාකර විෂයභාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ආඥාවකින් (ඒ ආඥාව මින්මතු "සංශෝධනය කිරීමේ ආඥාව" යනුවෙන් සඳහන් කරනු ලැබේ) (i) වන උප වගන්තිය යටතේ කලින් කරන ලද යම් ආඥාවක් ඕනෑම අවස්ථාවක වෙනස් කළ හැකිය. සෑම සංශෝධනය කිරීමේ ආඥාවක්ම එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දින ක්‍රියාත්මක විය යුතුය.

(ආ) සංශෝධනය කිරීමේ ආඥාවකින් වෙනස් කරනු ලබන (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක් එසේ වෙනස් නොකරන ලද්දේ නම් ක්‍රියාත්මක විය හැකිව තිබූ කාල පරිච්ඡේදය තුළ එසේ වෙනස් කරනු ලැබූ පරිදි අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතු අතර ඊට වැඩි කාලයක් එය ක්‍රියාත්මක නොවිය යුතුය.

(ඇ) සෑම සංශෝධනය කිරීමේ ආඥාවක්ම අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය.

එසේ වුවද (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද ආඥාවක් (4) වැනි උප වගන්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබීමට පෙර සංශෝධනය කිරීමේ ආඥාවකින් හෝ ආඥා වැඩි ගණනකින් වෙනස් කරනු ලැබූ අවස්ථාවක ඒ ආඥාව ඒ උප වගන්තිය යටතේ අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කළ විට ඒ සංශෝධනය කිරීමේ ආඥාවෙන් හෝ ආඥාවලින් ඇති කරන ලද සියළු වෙනස් කිරීම් එහි අන්තර්ගත කරනු ලැබිය යුතු අතර එවැනි යම් අවස්ථාවක දී එවැනි සංශෝධනය කිරීමේ ආඥාවක වෙන් වෙන් වශයෙන් මධ්‍යම පළාතේ පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවිය යුතුය.

(ඈ) අනුමැතිය සඳහා මධ්‍යම පළාතේ පළාත් සභාව ඉදිරියට ගෙන එනු ලැබූ යම් සංශෝධනය කිරීමේ ආඥාවක් මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කිරීම ඒ සංශෝධනය කිරීමේ ආඥාව පරිච්ඡින්න කරනු ලැබීමක් ලෙස සැළකිය යුතු අතර, (1) වැනි උප වගන්තියට යටතේ කරනු ලැබූ ආඥාව ඒ පරිච්ඡින්න කිරීමේ දිනයේ සිට ඒ සංශෝධනය කිරීමේ ආඥාව කරනු නොලැබුවාක් මෙන් අඛණ්ඩව ක්‍රියාත්මක විය යුතුය.

(6) (1) වැනි උප වගන්තිය යටතේ කලින් කරන ලද යම් ආඥාවක් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යාවරයා විසින් යම් විටෙක පරිච්ඡින්න කළ හැකිය. එවැනි යම් ආඥාවක් පරිච්ඡින්න කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කළ යුතු අතර ඒ ආඥාව පළ කිරීමේ දින සිට පරිච්ඡින්න කරන ලද ලෙස සළකනු ලැබිය යුතුය.

(7) සෑම ආඥාවක්ම මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබූ විට එය මෙහිලා පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

(8) මේ වගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කිරීමට නියමිත සෑම නිවේදනයක්ම මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යාවරයාගේ අත්සන යටතේ පළ කළ යුතුය.

(9) මේ වගන්තිය යටතේ කරන ලද යම් ආඥාවක විධි විධාන අන්කිසි ලිඛිත නීතියක විධි විධාන සමග නොගැලපීම හෝ ගැටීම නොතකා ඒ ආඥාව බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ඒ අන් ලිඛිත නීතිය අභිභවා ඒ විධිවිධාන බල පැවැත්විය යුතු ය.

(10) සෑම සාමාජිකයෙකු නොවන ලියාපදිංචි කළ සමිතියකට සමිතියක් මාර්ගයෙන් යම් භාණ්ඩයක් විකුණන ලෙස (1) වැනි උප වගන්තිය යටතේ ආඥාවකින් විධාන කරනු ලැබූ සෑම නිපදවන්නෙකුම ඒ විධානය අනුව වූ එවැනි යම් විකිණීමක් සම්බන්ධයෙන් හා ඒ විකිණීමෙන් උද්ගතවන යම් කරුණක් හෝ ගණුදෙනුවක් සම්බන්ධයෙන් ඔහු ඒ සමිතියේ සාමාජිකයෙකුව සිටියේ නම් යටත් විය හැකිව තිබූ කොන්දේසි හා බැඳීම්වලට ම යටත් විය යුතුය.

(11) (1) වැනි උප වගන්තිය යටතේ ආඥාවක් කරන ලද්දේ යම් නිපදවන්නකු සම්බන්ධයෙන් ද ඒ නිපදවන්නා වූ ද ලියාපදිංචි කරනු ලැබූ සමිතියේ සාමාජිකයෙකු නොවන්නා වූ ද යම් නිපදවන්නකු විසින් ඒ සමිතියේ සාමාජිකයෙකු ලෙස ඇතුළත්වීම සඳහා ඉල්ලුම් කරනු ලබන අවස්ථාවක සමිති විසින් -

(අ) ඔහු එසේ කැමති වන්නේ නම්, ඔහුගේ ගිණුමට සමිතියට ලැබුණු හෝ සමිතිය විසින් දරනු ලබන යම් අරමුදල් වලින් සාමාජිකත්වය සඳහා වූ දායක මුදල සම්පූර්ණයෙන්ම හෝ ඉන් යම් කොටසක් කපාගත යුතු ය ;

(ආ) ඉහත කී පරිදි යම් කපාගැනීමකට යටත්ව ඒ දායක මුදල සම්පූර්ණයෙන්ම ගෙවීමෙන් පසු ඔහු සාමාජිකයෙකු වශයෙන් ඇතුළත් කළ යුතුය.

23. (1) වෙන යම් තැනැත්තෙකු විසින් නිෂ්පාදනය කරන ලද යම් භාණ්ඩයක් ලියාපදිංචි කළ සමිතියකට හෝ ඒ සමිතිය මාර්ගයෙන් විකිණීමට ඒ වෙනත් තැනැත්තා 21 වැනි වගන්තිය යටතේ ගිවිසගෙන සිටින හෝ 22 වැනි වගන්තිය යටතේ වූ ආඥාවකින් බැඳී සිටින බව දැන සිටිය දී හෝ ඒ පිළිබඳ දැන්වීමක් ලැබ ඇතිව සිටිය දී අවස්ථාවෝචිත පරිදි ඒ ගිවිසුම කඩ කරමින් හෝ ඒ ආඥාවට පටහැනිව ඒ භාණ්ඩය විකිණීමට ; හෝ

භාරදීමට වෙනත් තැනැත්තා පොළඹවන හෝ කැමැති කරවා ගන්නා යම් තැනැත්තකු වරදකට වැරදිකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට යටත් විය යුතු ය.

(2) (1) වැනි උපවගන්තිය යටතේ වරදකට වරදකරු කරනු ලැබූ තැනැත්තා සංස්ථාවක් වන අවස්ථාවක, ඒ වරද කරන විට ඒ සංස්ථාවේ අධ්‍යක්ෂ වරයෙකු හෝ නිලධාරියෙකුව සිටි තැනැත්තෙකුට, ඒ වරද සිදු කරන ලද්දේ තමා නොදැනුවත්ව හෝ ඒ වරද සිදු කිරීම වැලැක්වීම සඳහා නිසි සියළු උද්යෝගයෙන් තමා ක්‍රියාකළ බව ඔහු විසින් ඔප්පු කරනු ලැබුහොත් මිස ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

24. ණයකරුවෙකුගේ දේපළ සම්බන්ධයෙන් ජනරජයේ හෝ පළාත් සභාවේ ප්‍රමුඛතා හිමිකමට හා කුළී හෝ කුළී වශයෙන් අය කර ගත හැකි යම් මුදලක් සම්බන්ධයෙන් ඉඩම් හිමියෙකුගේ කැප අයිතියට හෝ කලින් ලියාපදිංචි කරන ලද යම් බැඳීමකට යටත්ව

යම් සාමාජි... අයත් වගා ... වෙයන්, උප... අමු ද්‍රව්‍ය හා... නිෂ්පාදිත ... සම්බන්ධයෙ... ලියාපදිංචි ක... සමිතියක අයිතිවාසිකම්

(අ) යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් ලියාපදිංචි කළ සමිතියකට ගෙවිය යුතු යම් ණයක් හෝ සපුරා නොමැති ඉල්ලීමක් -

(i) ඒ සාමාජිකයා හෝ කලින් සිටි සාමාජිකයා විසින් සමිතියෙන් ගත් ණය මුදලකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් වැටූ වගාවක් හෝ එසේ ලබාගත් වෙනත් කෘෂි ද්‍රව්‍යයක් හෝ කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය ;

(ii) සමිතිය විසින් සාමාජිකයෙකුට හෝ කලින් සිටි සමාජිකයෙකුට දෙන ලද මුදලින් හෝ භාණ්ඩ වලින් වූ යම් ණයකින් සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඔහුට සපයන ලද හෝ ඔහු විසින් මිළට ගනු ලැබූ යම් ගවයන්, ගවයන් සඳහා වූ ආහාර, කෘෂිකාර්මික හෝ කාර්මික උපකරණ හෝ නිෂ්පාදනයට ගන්නා අමු ද්‍රව්‍ය දැනුම්දීමක් නොමැතිව සද්භාවයෙන් මිළට ගන්නා ගැනුම්කරුවෙකුගේ හෝ පැවරුම් ලාභියෙකුගේ හිමිකම් කෙරෙහි බල නොපෑ යුතු ය. තව ද,

(iii) 1961 අංක 33 දරන කෘෂිකාර්මික නිෂ්පාදන (සහතික මිළ හා පැහීම හා කෙටීම පාලනය කිරීමේ) පනත යටතේ යම් උපලේඛනගත කෘෂිකාර්මික නිෂ්පාදනයක් මිළට ගැනීම සම්බන්ධයෙන් ඒ සාමාජිකයාට සමිතියෙන් අය විය යුතු යම් මුදලක් කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය.

(ආ) ගෙවල් කුලිය, කොටස්, ණය මුදල් හෝ ගැනුම් මුදල් සම්බන්ධයෙන් යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් නිවාස සංගමයකට ගෙවිය යුතු යම් සපුරා නොමැති ඉල්ලීම් හෝ නොගෙවා ඇති ගාස්තු හෝ ඒ සමිතියට ගෙවිය යුතු වෙනයම් අයිතිවාසිකම් හෝ මුදල් සමිතියේ නිශ්චල දේපළ පිළිබඳ ඔහුගේ සම්බන්ධතාව කෙරෙහි පළමු බැඳීමක් විය යුතු ය.

සාමාජිකයන්ගේ කොටස් හෝ සම්බන්ධතා කෙරෙහි බැඳීම් හා හිලව් කිරීම

25. සාමාජිකයෙකුගෙන් කලින් සිටි සාමාජිකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ බුදලයෙන් -

(අ) සමිතියට අයවිය යුතු යම් ණයක් ;

(ආ) අන්කිසි ලියාපදිංචි කළ සමිතියකට අය විය යම් ණයක් ; හෝ

(ඇ) යම් ලියාපදිංචි කළ සමිතියක ඇවරකරුට අය විය යුතු යම් මුදලක් ;

පියවීම සඳහා, ඒ සාමාජිකයාගේ, කලින් සිටි සාමාජිකයාගේ හෝ මියගිය සාමාජිකයාගේ ප්‍රාග්ධනයෙහි කොටසක් හෝ වෙනත් සම්බන්ධතා හා තැන්පතු කෙරෙහි ද සාමාජිකයාට හෝ කලින් සිටි සාමාජිකයාට හෝ මියගිය සාමාජිකයාගේ බුදලයට ගෙවිය යුතු යම් ලාභාංශයක්, ප්‍රසාද මුදලක් හෝ ලාභ කෙරෙහි ද ලියාපදිංචි කළ සමිතියකට බැඳීමක් තිබිය යුතු අතර සාමාජිකයකුට හෝ කලින් සිටි සාමාජිකයකුටහෝ මියගිය සාමාජිකයෙකුගේ බුදලයට බැර කෙරෙන හෝ ගෙවිය යුතු යම් මුදලක් හිලව් කිරීම හෝ එවැනි ණයක්, හෝ මුදලක් ගෙවීමෙහිලා හෝ ගෙවීම සම්බන්ධයෙන් අවස්ථාවෝචිත පරිදි ඒ අන් සමිතියට හෝ ඇවරකරුට ගෙවීම ඒ ලියාපදිංචි කළ සමිතිය විසින් කළ හැකි ය.

කොටස්, දායක මුදල් හා වෙනත් සම්බන්ධතා තහනම් කිරීමට හෝ විකිණීමට යටත් නොවන බව.

26. 25 වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග් ධනයෙහි සාමාජිකයෙකුගේ කොටස, දායක මුදල හෝ වෙනත් සම්බන්ධතා ඒ සාමාජිකයා විසින් ඇතිකර ගන්නා ලද යම් ණයක් හෝ වගකීමක් සම්බන්ධයෙන් අධිකරණයක යම් තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ තහනමට ගැනීමට හෝ විකිණීමට යටත් නොවිය යුතු ය. එසේ බුන්වත් වීමෙහි දී පත්කරනු ලබන ඔහුගේ පැවරුම් ලාභියාට හෝ සිවිල් නඩු විධාන සංග්‍රහයේ I වැනි පරිච්ඡේදය යටතේ පත් කරනු ලබන භාරගන්නෙකුට ඒ කොටසට, දායක මුදලට හෝ වෙනත් සම්බන්ධතාවට කිසිදු හිමිකමක් හෝ ඒ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑමේ කිසිම අයිතියක් නොතිබිය යුතු ය.

සාමාජිකයා මිය ගිය විට සම්බන්ධතා පැවරීම.

27. (1) සාමාජිකයෙකු මියගිය පසු ලියාපදිංචි කළ සමිතියක් විසින් ඒ මියගිය සාමාජිකයාගේ කොටස් හෝ වෙනත් සම්බන්ධතා ඒ වෙනුවෙන් සාදනු ලැබූ රීති අනුව නම් කරනු ලැබූ තැනැත්තකුට, හෝ එසේ නම් කරනු ලැබූ කිසිම තැනැත්තකු නොසිටී නම් මියගිය සාමාජිකයාගේ නීත්‍යානුකූල උරුමකරු, හෝ නියෝජිතයා ලෙස කාරක සභාවට පෙනී යා හැකි වෙන යම් තැනැත්තෙකුට පැවරිය හැකි ය. නැතහොත් රීති හෝ අතුරු ව්‍යවස්ථා අනුව නිශ්චය කරනු ලැබූ ඒ සාමාජිකයාගේ කොටසේ හෝ වෙනත් සම්බන්ධතාවේ වටිනාකමට සමාන මුදලක් නම් කළ තැනැත්තාට, උරුමකරුට, හෝ නීත්‍යානුකූල නියෝජිතයාට ගෙවිය හැකි ය.

එසේ වුව ද,

(අ) සීමා රහිත වගකීම්වලින් යුත් සමිතියක් සම්බන්ධයෙන් වූ විට අවස්ථාවෝචිත පරිදි ඒ නම් කරනු ලැබූ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා විසින් මිය ගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතාව සම්බන්ධයෙන් ඉහත කී පරිදි නිශ්චය කරනු ලැබූ වටිනාකම සමිතිය විසින් ගෙවන ලෙස ඉල්ලා සිටිය හැකි ය.

(ආ) සීමාසහිත වගකීම්වලින් යුත් සමිතියක් සම්බන්ධයෙන් වූ විට සමිතිය විසින්, මිය ගිය සාමාජිකයාගේ කොටස හෝ වෙනත් සම්බන්ධතා, සමිතියේ සාමාජිකත්වය සඳහා රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සුදුසුකම් ලත් අවස්ථාවෝචිත පරිදි ඒ නම් කළ තැනැත්තා, උරුමකරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත හෝ මිය ගිය තැනැත්තාගේ මරණයෙන් පසු හය මාසයක් ඇතුළත ඔහු විසින් කරනු ලබන ඉල්ලීමෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබූ එසේ සුදුසුකම් ලත් වෙන යම් තැනැත්තකු වෙත පැවරිය හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු විසින් ඒ ලියාපදිංචි සාමාජිකයාට ගෙවිය යුතු වෙනත් සියලු මුදල්

අවස්ථාවෝචිත පරිදි ඒ නම්කළ තැනැත්තා, උරුම්කරු හෝ නීත්‍යානුකූල නියෝජිතයා වෙත ගෙවිය යුතු ය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින්, මේ වගන්තියේ විධිවිධාන අනුව කරන ලද සියලු පැවරීම් හා ගෙවීම්, වෙන යම් තැනැත්තකු විසින් සමිතියට ඉදිරිපත් කරනු ලබන යම් ඉල්ලීමකට විරුද්ධව වලංගු හා බලසහිත විය යුතු ය.

බාලවයස් කරුවකු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන තැන්පතු.

28. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් බාලවයස් කරුවන්ගෙන් හෝ ඔවුන්ගේ අර්ථලාභය සඳහා තැන්පතු භාරගත හැකි අතර, ඒ තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය යුතු විය හැකි පොලිය බාල වයස්කරුවන්ට ලියාපදිංචි කළ සමිතියක් විසින් ගෙවීම නීත්‍යානුකූල විය යුතුය. බාල වයස් කරුවකු විසින් කරන ලද යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමඟ ඒ බාලවයස්කරුට ගෙවනු ලැබිය හැකිය. තවද බාලවයස්කරුවෙකු වෙනුවෙන් වූ යම් තැන්පත් කිරීමක් ඊට එකතු වූ පොලියත් සමඟ ඒ බාලවයස්කරුගේ ප්‍රයෝජනය සඳහා ඒ බාලවයස්කරුගේ භාරකරු වෙත ගෙවනු ලැබිය හැකිය.

(2) මේ වගන්තිය යටතේ සමිතියක් විසින් යම් බාලවයස්කරුවකුට හෝ භාරකරුවකුට ගෙවන ලද මුදල් සඳහා ඔහුගෙන් ලබාගන්නා ලදුපතක් ඒ මුදල් සම්බන්ධයෙන් ඒ සමිතියේ වගකීම ඉටුකළ බවට ප්‍රමාණවත් නිදහස් කිරීමක් විය යුතු ය.

සමිතියේ ණය සම්බන්ධයෙන් මිය... සාමාජිකයා හා මි... ගිය සාමාජිකයාගේ මුදලය බැඳී ඇති බව.

29. (1) ඉවත්වූ සාමාජිකයකු සාමාජිකයකුව සිටීම කෙළවර වූ දින පැවැතියාවූ ලියාපදිංචි කළ සමිතියක ණය සම්බන්ධයෙන් ඔහු ගේ බැඳීම ඒ දින සිට ගණන් බලනු අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් තුළ අඛණ්ඩව පැවතිය යුතු ය.

(2) සාමාජිකයෙකු මිය ගිය දින සිට ගණන් බලනු අවුරුදු දෙකක කාලපරිච්ඡේදයක් තුළ ඔහුගේ මුදලය, ඔහු මියගිය දින පැවති සමිතියේ ණය සම්බන්ධයෙන් බැඳී තිබිය යුතු ය.

සාමාජිකයන්ගේ නා... ලේඛනය.

30. යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සාමාජිකයන්ගේ යම් නාම ලේඛණයක් හෝ ලැයිස්තුවක් එහි සටහන් කරන ලද පහත සඳහන් විස්තරවලින් යම් විස්තරයක් පිළිබඳව මැලු බැල්මට පිළිගත හැකි සාක්ෂිය විය යුතු ය :-

(අ) සාමාජිකයකු වශයෙන් යම් තැනැත්තකුගේ නම ඒ නාම ලේඛනයෙහි හෝ ලැයිස්තුවෙහි සටහන් කරන ලද දිනය ;

(ආ) එබඳු යම් තැනැත්තකු සාමාජිකයකුව සිටීම නතර කළ දිනය.

සමිතියේ පොත්වල සටහන් ඔප්පු කිරීම

31. (1) ලියාපදිංචි කළ සමිතියක් ගනු දෙනු කිරීමෙහි දී විධිමත් ලෙස තබන ලද පොතක වූ යම් සටහනක පිටපතක් රීතිවලින් නියම කරනු ලැබිය හැකි යම් ආකාරයකින් සහතික කරනු ලැබුවේ නම් ඒ සටහන පැවති බවට බැලු බැල්මට පිළිගත හැකි සාක්ෂියක් ලෙස යම් සිවිල් හෝ අපරාධ නීති කෘත්‍යකදී පිළිගත යුතු ය. තව ද ඒ මුල් සටහන පිළිගනු ලබන සෑම අවස්ථාවක දී ම හා පිළිගනු ලබන ප්‍රමාණයටම ඒ පිටපතෙහි සටහන් කරන ලද කරුණු, ගනුදෙනු හා ගණන් පිළිබඳ සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු ය.

(2) ලියාපදිංචි කළ සමිතියක් පාර්ශවකරුවකු නොවන යම් නීති කාර්යක දී

(1) වැනි උප වගන්තිය යටතේ ඔප්පු කළ හැකි කරුණු අඩංගු සමිතියේ පොත්වලින් යම් පොතක් ඉදිරිපත් කරන ලෙස හෝ එහි සටහන් කරන ලද යම් කරුණු, ගනුදෙනු හෝ ගණන් ඔප්පු කිරීම පිණිස සාක්ෂිකරුවකු වශයෙන් පෙනී සිටින ලෙස, අධිකරණය විසින් විශේෂ හේතු කරණකොට ගෙන එසේ කිරීමට විධානය කරනහොත් මිස, ඒ සමිතියේ කිසිම නිලධරයකුට බල නොකළ යුතු ය.

සමිතියක් විසින් මඩපන වශයෙන් කුම්පත් තැන්පත් කිරීම.

32. තත් කාලයෙහි බලපවත්නා ලිඛිත නීතියක් හෝ වෙනත් නීතියක් නොතකා, ලියාපදිංචි කළ සමිතියක් විසින් :-

(අ) සාමාන්‍ය හිඟුම් තුලනයක් සඳහා ඇපය වශයෙන් ඒ සමිතිය සතු යම් සුරැකුම්පත් මඩපනය කළ හැකි ය. තවද,

(ආ) සමිතිය වෙත නිකුත් කරනු ලැබූ දැන්වීමක් අවසන් වන දිනයෙහි මුදල් ගෙවීම නොකරන ලද්දේ, නම් අධිකරණය වෙත නොගොස් ඒ සුරැකුම්පත් වලින් යමක් හෝ ඒ සියල්ලම විකුණා එයින් ලැබෙන මුදල් ඒ හිඟුම් තුලනයට බැර කරන ලෙස ණයහිමියාට බලය පැවරිය හැකි ය.

දේපල අත්කර ගැනීමේ හා විකිණී... අයිතිය

33. ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි පරමාර්ථවලට සම්බන්ධ යම් කාර්යයක් සඳහා ඉඩම්, ගොඩනැගිලි හෝ වෙනත් චංචල හෝ නිශ්චල දේපළ මිලට ගැනීමෙන්, තෑගි වශයෙන් හෝ වෙනත් ආකාරයකින් අත්කර ගැනීම හා බද්දට ගැනීම හෝ, විකිණීම උකස් කිරීම, බද්දට දීම, හුවමාරු කිරීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම කළ හැකි ය.

එසේ වුවද යම් නිශ්චිත දේපළකට හෝ මේ ප්‍රඥප්තිය යටතේ එය වෙනුවෙන් සාදනු ලැබූ රීතිවල නිශ්චිතව සඳහන් කරන ලද යම් චංචල දේපලකට අදාළ මේ වගන්තියේ පෙරාතුව වූ විධි විධානයන් හි සඳහන් යම් ගනුදෙනුවක් සම්බන්ධයෙන් වූ විට රෙජිස්ට්‍රාර්ගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබාගත යුතු ය.

ඉඩම් හා ගොඩනැ... අනිවාර්යයෙන් අ... ගැනීම.

34. (1) ලියාපදිංචි කළ සමිතියක පරමාර්ථවලට සම්බන්ධ යම්කාර්යයක් සඳහා යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අවශ්‍ය වන අවස්ථාවක ඒ කාර්යය පොදු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර ආණ්ඩුව විසින් ඒ සමිතිය සඳහා ඉඩම අත්කර ගැනීමේ පනත යටතේ ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල අත්කර ගත හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක් සඳහා ආණ්ඩුව විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ යම් ඉඩමක් හෝ ගොඩනැගිල්ලක් අත්කර ගත යුතු අවස්ථාවක ඒ සමිතිය විසින්, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ඒ පනතේ 38 වැනි වගන්තිය යටතේ ආඥාවක් කරනු ලැබීමට පෙර ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් ඒ පනත යටතේ නිශ්චය කරනු ලැබූ මුදල හා අත්කර ගැනීමේ කටයුතුවල දී ආණ්ඩුව විසින් දරනු ලබන වියදම් ද ආණ්ඩුව ගෙවිය යුතුය.

එසේ වුව ද ඒ පනත යටතේ වන්දි මුදල නියම කිරීමට පෙර යම් හදිසි කාර්යයක් හේතුකොට ගෙන යම් ඉඩමක් හෝ ගොඩනැඟිල්ලක් අත්කර ගැනීම අවශ්‍ය වන අවස්ථාවක, ඒ ඉඩම හෝ ගොඩනැගිල්ල සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දිය වශයෙන් නියම කරනු ලැබිය හැකි යයි අත්කර ගැනීමේ නිලධරයා අදහස් කරන යම් මුදලක් ඒ ආඥාව කිරීමට පෙර ඒ සමිතිය විසින් ආණ්ඩුවට ගෙවිය යුතු අතර, ඉතුරු මුදලක් ඇතොත් ඒ ඉතුරු මුදල ඒ පනත යටතේ වන්දි මුදල නියම කරනු ලැබීමෙන් පසු ගෙවිය යුතුය.

## V වැනි පරිච්ඡේදය

### *අතුරු ව්‍යවස්ථාවලට අදාළ සාමාන්‍ය විධිවිධාන*

**සමිතියක අතුරු ව්‍යවස්ථාවලින් සාමාජිකයන් බැඳෙන බව**

35. (1) ලියාපදිංචි කළ සමිතියක සෑම අතුරු ව්‍යවස්ථාවකින්ම එම අතුරු ව්‍යවස්ථාව ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු ඒ සමිතියේ එක් එක් සාමාජිකයා විසින් එම අතුරු ව්‍යවස්ථාවේ විධිවිධාන පිළිපැදීමට එක් එක් සාමාජිකයා දුන් පොරොන්දුවක් එම අතුරු ව්‍යවස්ථාවට ඇතුළත් වූයේ නම් කෙරෙන ප්‍රමාණයටම සමිතිය ද එහි සාමාජිකයන් ද බැඳී සිටිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක අතුරු ව්‍යවස්ථාවක අර්ථ නිරූපනය සම්බන්ධයෙන් පැන නගින යම් ආරවුලක් තීරණය කිරීම සඳහා රෙජිස්ට්‍රාර් වෙත යොමු කළ යුතු අතර ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය නීත්‍යානුකූලව අවසානාත්මක හා තීරණාත්මක විය යුතුය.

**ව්‍යාපාර සහනම් කරන අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය.**

36. අතුරු ව්‍යවස්ථා සෑදීමට යම් රීතියකින් බලය පැවරුනු යම් කරුණක් සම්බන්ධයෙන් ලියාපදිංචි කළ සමිතියක් විසින් සාදන ලද කිසිම අතුරු ව්‍යවස්ථාවක් එය ව්‍යාපාර සහනම් කිරීමේ ගිවිසුමක්ය යන හේතුව පිට පමණක් කිසිම අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතුය.

**සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා සෑදීමේ බලය**

37. ලියාපදිංචි කළ යම් සමිතියක් විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවලින් සමිතියේ අතුරු ව්‍යවස්ථා කඩ කිරීම සම්බන්ධයෙන් එහි සාමාජිකයන්ට දඩ නියම කිරීම සඳහා රීතිවලට යටත්ව විධිවිධාන සැලැස්විය හැකිය. එසේ වුවද-

(අ) සමිතිය විසින් ඒ දඩය නියම කිරීමට අදහස් කරන බව හා ඊට හේතු ඔහු වෙත ලියවිල්ලකින් දනුම් දී ඇත්නම් මිස, හා

(ආ) රීතිවලින් නියම කරනු ලැබිය හැකි කාලයක් තුළ හා ආකාරයකින් ඒ දඩය නියම කිරීමට විරුද්ධව ප්‍රමාණවත් හේතු දක්වීමට ඔහු අපොහොසත් වී ඇත්නම්මිස

කිසිම සාමාජිකයෙකුට ඒ දඩය නියම නොකළ යුතුය.

## VI වැනි පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතිවල දේපළ හා අරමුදල්*

**ලියාපදිංචි කළ සමිතිවලින් දෙනු ලබන ණය**

38 (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයෙකු නොවන කිසිම තැනැත්තෙකුට යම් ණය මුදලක් නොදිය යුතුය. එසේ වුවද, ලියාපදිංචි කළ සමිතියක් විසින් රෙජිස්ට්‍රාර්වරයාගේ අනුමැතිය ඇතිව සහ ඔහු විසින් නියම කරනු ලබන කොන්දේසි මත පමණක් ලියාපදිංචි කළ සමිතියකට ණය දීම සහ බදු බෙදු හැරීම සඳහා සමිතියේ අනු නියෝජිතයෙකු පත් කරන ලද යම් ලියාපදිංචි කළ වෙළෙන්දෙකු වෙත ඒ බදු ණයට සැපයීම කරනු ලැබිය හැකිය. රෙජිස්ට්‍රාර්ගේ කැමැත්ත ඇතිව ලියාපදිංචි කළ සමිතියක් විසින් ලියාපදිංචි කළ අන් සමිතියකට ණය දිය හැකිය.

(2) රෙජිස්ට්‍රාර්ගේ අවසර ඇතිව විනා ලියාපදිංචි කළ සමිතියක් විසින් කෘෂිකාර්මික ද්‍රව්‍ය නොවන වෙනයම් චංචල දේපළක් ඇපයට ලබාගෙන මුදල් ණයට නොදිය යුතු ය.

**ලියාපදිංචි කළ සමිති විසින් භාරගනු ලබන තැන්පතු හා ණය මුදල්**

39. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් රීතිවලින් හෝ අතුරු ව්‍යවස්ථාවලින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයකට හා එසේ නියම කරනු ලැබිය හැකි කොන්දේසි යටතේ පමණක් සාමාජිකයන් නොවන තැනැත්තාගේ තැන්පතු හා ණය මුදල් භාරගත යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් නිශ්චල හෝ චංචල දේපළක උකස් පිට බැංකුවක් විසින් ණය මුදලක් දෙන ලද අවස්ථාවක ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ ඒ උකස ලියාපදිංචි කිරීමේ දිනයට පෙර එම ආඥාපනත යටතේ යථා පරිදි ලියාපදිංචි කරන ලද්දා වූ ද එම දේපලට බලපාන්නා වූ ද උකස් හෝ එසේ ලියාපදිංචි කරන ලද උකසකින් ආරක්ෂිත එසේ බලපාන්නා වූ ගෙවීමට බැඳීසිටීමක් හැර එම දේපලට බලපාන්නා වූ ඒ ලියාපදිංචි කරන ලද සමිතියේ කවර වූ හෝ අන්සෑම ණයකට හෝ එසේ බලපාන්නා වූ සෑම උකසකට හෝ ගෙවීමකට බැඳී සිටීමකට ඉහලින් ප්‍රමුඛස්ථානය ඇතිව ඒ උකස ලියා පදිංචි කිරීමේ දිනයෙහි සිට හා ඉන්පසු ඒ උකස යටතේ වූ මුදල් ගෙවීමට ඒ දේපළ බැඳී තිබිය යුතුය.

(40) ලියාපදිංචි කළ සමිතියක් විසින් සාමාජිකයින් නොවන තැනැත්තන් සමග කරනු ලබන ගනු දෙනු 38 හා 39 වැනි වගන්තිවල විධිවිධාන සලසා ඇති පරිදි හැර, රීතිවලින් නියම කරනු ලැබිය හැකි තහනම් හා සීමා කිරීම්වලට යටත් විය යුතුය.

41. (1) ලියාපදිංචි කළ සමිතියක් විසින් භාර ආඥාපනතේ 20 වැනි වගන්තියෙහි නිශ්චිතව සඳහන් නිශ්චල දේපලක් පිළිබඳ පළමු උකසක් නොවන යම් සුරකුම්පත්වල හෝ යම් බැංකුකරුවෙකු සමග හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද බැංකු කරුවකු වශයෙන් ක්‍රියා කරන යම් තැනැත්තකු සමග හෝ රෙජිස්ට්‍රාර් විසින් මේ කාර්යය සඳහා අනුමත කරන ලද වෙන යම් ලියාපදිංචි කළ සමිතියක කොටස්වල හෝ ඇපය පිට හෝ රීතිවලින් අවසරය දෙන ලද වෙනයම් ආකාරයකින් සමිතියේ අරමුදල් තැන්පත් කිරීමට හෝ ආයෝජනය කිරීම කළ හැකිය.

(2) මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක සිබුනේ නම් වලංගු විය හැකිව තිබූ මේ ප්‍රඥප්තිය ආරම්භවීමට පෙර කරන ලද යම් තැන්පතුවක් හෝ ආයෝජනයක් මෙයින් වලංගුකර ස්ථිර කරනු ලැබේ.

42. (1) ලියාපදිංචි කළ සෑම සමිතියක්ම විසින් 44 වැනි වගන්තිය යටතේ විගණක විසින් නිශ්චය කරනු ලබන පරිදි යම් මුදල් වර්ෂයක් තුළ එහි වූ ශුද්ධ ලාභවලින් - ලාභ පිළිබඳ ... කිරීම.

(අ) ඒ ශුද්ධ ලාභවලින් සියයට විසිපහකට නොඅඩු යම් මුදලක් සමිතියේ නිදන් අරමුදලට ව්‍යවස්ථාපිත සංචිතයට මාරු කළ යුතුය. එමෙන්ම,

(ආ) රීති යටතේ පිහිටුවන ලද සමුපකාර අරමුදලට ශුද්ධ ලාභවලින් රීති මගින් නියම කරනු ලැබිය හැකි යම් කොටසක් දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

(2) ශුද්ධ ලාභවල ශේෂය පහත සඳහන් කාර්යයන් සියල්ලම හෝ ඉන් යමක් සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකිය-

(අ) සාමාජිකයන් විසින් ගෙවා නිම කරන ලද කොටස් ප්‍රාග්ධනය සම්බන්ධයෙන් රීතිවලින් නියමිත ප්‍රමාණයට නොවැඩි ප්‍රමාණය අනුව සාමාජිකයන්ට ලාභාංශ ගෙවීම

(ආ) සාමාජිකයන් විසින් සමිතිය සමග කරන ලද ගනුදෙනුවල වටිනාකම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවල නියමිත ප්‍රමාණයට හා ආකාරයකින් ඔවුන්ට ප්‍රතිදාන ගෙවීම

(ඇ) අතුරු ව්‍යවස්ථාවල නියම කරනු ලැබිය හැකි යම් අරමුදල්වලට දායක මුදල් ගෙවීම

(ඉ) අතුරු ව්‍යවස්ථාවල නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අන් කිසිවකට කරනු ලබන ගෙවීම්

(ඊ) යම් සමාජයීය, සංස්කෘතික හෝ විනෝද කාර්යයන් පිණිස හෝ ප්‍රාදේශීය හෝ මහජන ප්‍රයෝජනය සඳහා වූ වෙනයම් අරමුදලක් සඵල කිරීම සඳහා වැය කිරීම පිණිස පොදු සුභසාධක අරමුදලට ශුද්ධ ලාභවලින් සියයට දහයකට නොවැඩි මුදලක් ගෙවීම.

(3) වගකීම් සීමා රහිත සමිතියක් සම්බන්ධයෙන් වූ විට රෙජිස්ට්‍රාර්ගේ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක් නොමැතිව කිසිම ලාභ බෙදීමක් නොකළ යුතුය.

## VII වැනි පරිච්ඡේදය

### ගිණුම්, අයවැය, විගණනය, විභාගය, සමීක්ෂණය හෝ විමර්ශනය

43. (1) සෑම ලියාපදිංචි සමිතියක්ම, සමිතියේ ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පවත්වාගෙන යාමට සැලැස්විය යුතුය. සමිතියේ ගිණුම

(2) රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තෙකු විසින් නියම කරනු ලබන පරිදි, සමිතියේ කටයුතුවලට අදාළ ගිණුම් හා සංඛ්‍යාත පිළිබඳ වාර්ෂික ප්‍රකාශයක් සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින් ම සකස් කරනු ලැබිය යුතුය. ඒ ගිණුම් ප්‍රකාශය, එය අදාළ වන මුදල් වර්ෂය අවසන් වී මාස තුනක් ඇතුළත රෙජිස්ට්‍රාර්වරයා වෙත හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් තැනැත්තා වෙත හෝ ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) මේ වගන්තියේ විධි විධානවලින් කිසිවක් අනුව කටයුතු කිරීම ලියාපදිංචි කළ සමිතියක් විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, ඒ සමිතියේ කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම වරදකට වරදකරු වන අතර, මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියේ පවත්වනු ලබන ලඝුනඩු විභාගයකින් පසුව වරදකරුවකු කරනු ලැබූ විට රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ඔහු යටත්විය යුතුය.

එසේ වුවද වරදක් කරනු ලැබුවේ තමාගේ අනුදැනීම නොමැතිව බව සහ ඒ වරද කිරීම වැළැක්වීමට නිසි සියලු උද්යෝගයෙන් තමා සැමවිටම ක්‍රියා කළ බව ඒ සාමාජිකයා විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු ඒ වරදට වරදකරු නොවන්නේය.

43.(අ) (1) සෑම ලියාපදිංචි කළ සමිතියක් විසින්ම, ආදායම් ඉලක්ක පුනරාවර්තන සහ ප්‍රාග්ධන වියදම, මූල්‍ය සහ මුදල් සම්පත්, මුදල් ආයෝජන, අයවැය ගණකරන ලද ලාභා ලාභ ගිණුම, ආදායම් සහ වියදම් ගිණුම් සහ ශේෂ පත්‍ර දක්වෙන අයවැය ලේඛනයක් සෑම මුදල් වර්ෂයක් වෙනවෙනම පිළියෙල කරනු ලැබිය යුතුය. අයවැය පිළියෙල කිරීම

(2) ඒ අයවැය ලේඛණය අදාළ වන මුදල් වර්ෂ ආරම්භ වීමට පෙරාතුව වූ මාස දෙකට කලින් එය අනුමැතිය සඳහා සමිතියක් මහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතුය.

(3) එම අයවැය ලේඛනය අදාළ වන මුදල් වර්ෂය ආරම්භවීමට පෙරාතුව වූ එක් මාසයකට කලින්, ඒ අයවැය ලේඛනයේ පිටපතක් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවනු ලැබිය යුතුය.

(4) එම අයවැය ලේඛනය පිළියෙල කරනු ලැබිය යුතු ආකෘතිය සහ ආකාරයද, එහි අඩංගු විය යුතු අවම තොරතුරු ද රෙජිස්ට්‍රාර්වරයා විසින් නිර්ණය කරනු ලබන පරිදි විය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව සහ එහි ආදායම සහ වියදම සැලකිල්ලට ගෙන මේ වගන්තියේ අවශ්‍යතාවලින් යම් සමිතියක් නිදහස් කිරීම අවස්ථානුකූලයයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක විශේෂ හෝ සාමාන්‍ය නියමයක් මගින් යම් සමිතියක් අමාත්‍යවරයා විසින් මේ වගන්තියේ අවශ්‍යතාවලින් නිදහස් කරනු ලැබිය හැකිය.

විගණනය

44 (1) සෑම අවුරුද්දකට වරක්වත් සෑම ලියාපදිංචි කරනු ලැබූ සමිතියකම ගිණුම් රෙජිස්ට්‍රාර් විසින් විගණනය කිරීම හෝ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයක මාර්ගයෙන් ඔහු විසින් බලය පවරනු ලබන යම් තැනැත්තකු ලවා විගණනය කරවීම කළ යුතුය.

(2) (1) වැනි උප වගන්තිය යටතේ වූ විගණනයට ගෙවිය යුතු කාලය ඉක්ම ගොස් ඇති ණය ඇතොත්, ඒ ණය පිළිබඳ පරීක්ෂණයක් හා ලියාපදිංචි කළ සමිතියේ වත්කම් හා බැරකම් අගය කිරීමක් ද ඒ පිළිබඳ හරිවැරදි බැලීමක් ද ඇතුළත්විය යුතුය.

(3) (1) වන උප වගන්තිය යටතේ විගණනයක කාර්යයක් සඳහා රෙජිස්ට්‍රාර්ට හෝ ඒ ගිණුම් විගණනය කිරීම පිණිස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට -

(අ) රෙජිස්ට්‍රාර්ගේ හෝ විගණනය සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගනුදෙනු හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ යම් නිලධරයෙකු නියෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු හෝ වෙනයම් තැනැත්තකු කැඳවීම,

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක් හෝ සමිතියට අයත් යම් මුදලක් සුරකුම් පතක් හෝ වෙනත් දේපලක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව හෝ භාරව සිටින, කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ නිලධරයකුට, නියෝජිතයකුට, සේවකයකුට හෝ සාමාජිකයකුට හෝ වෙනයම් තැනැත්තකුට නියම කිරීමේ ; හා

(ඇ) ඒ විගණනයේ දී තමා විසින් වංචාවක් සොයාගනු ලබන අවස්ථාවක සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමේ බලය තිබිය යුතුය.

(4) රෙජිස්ට්‍රාර්වරයාට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඊට කාර්යය සඳහා සාමාන්‍ය හෝ විශේෂ නියමයක් මගින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ලියාපදිංචි කළ සමිතියක් විසින් පවත්වාගෙන යනු ලබන සියලු පොත්, ලේඛන, ගිණුම් සහ ලියවිලි, සුරකුම් පත් සහ අතේ ඇති මුදල් සියලු අවස්ථාවලදී ලබා ගැනීමට ද, පරීක්ෂා කිරීමට ද, හිමිකම තිබිය යුතුය. තවද ඉහත කී දේ භාරව සිටින හෝ පවත්වා ගෙන යන හෝ සන්තකයෙහි ඇතිව සිටින සෑම තැනැත්තකුම ඒවා රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඒ බලය දෙන ලද තැනැත්තාට ඉදිරිපත් කළ යුතුය.

නැතහොත් සමිතියේ ගනුදෙනු සහ වැඩ කටයුතු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයා හෝ ඒ පරීක්ෂණය හෝ විගණන කරන ඒ බලය දෙන ලද තැනැත්තා විසින් නියම කරනු ලබන තොරතුරු සැපයිය යුතුය.

(5) රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි කළ සමිතියක ගිණුම් විගණන කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතුය.

(6) (අ) සමිතියක සංවිධානය හෝ කළමනාකාරිත්වය භාරව සිටින හෝ භාරව සිටි හෝ සමිතියක නිලධරයකුට හෝ සේවකයකුව සිටින හෝ කවර හෝ අවස්ථාවක සිටි යම් තැනැත්තකු විසින් මේ ප්‍රඥප්තිය යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ සාදනු ලැබූ රීතිවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද, සමුපකාර සමිතිවලට හෝ මුදල් කාර්ය පරිපාටියට අදාළ රීතිවල නැතහොත් නියෝගවල හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද පොදු විධාන සිහිවත හෝ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල හෝ සමිතියේ කාරක රීතිවල විධි විධානයන්ට පටහැනිව යම් ගෙවීමක් කර ඇති බව හෝ සමිතියේ යම් අරමුදල් පාවිච්චි කර ඇති බව

(1) වැනි උප වගන්තිය යටතේ වූ විගණනයක් පැවැත්වෙද්දී හෝ එය අවසානයේ දී සොයා ගතහොත් රෙජිස්ට්‍රාර් විසින් එවැනි සෑම ගෙවීමකටම හා එවැනි සෑම අරමුදල් පාවිච්චි කිරීමකට ම ඉඩ නොදිය යුතු අතර, ඒ නීති විරෝධී ගෙවීම හෝ අරමුදල් පාවිච්චි කිරීම කරන හෝ කිරීමට බලය දෙන තැනැත්තාට එය අධිභාර කළ යුතුයි. තවද ඒ තැනැත්තාගේ නොසැලකිල්ල හෝ විෂමාචාරය හේතුකොට ගෙන දරන්නට සිදු වූ යම් ඌනතාවයක් හෝ පාඩුවක් සහ ඒ තැනැත්තා විසින් ගිණුම් දැක්විය යුතු වූ නමුත් එසේ ගිණුම් නොදක්වන ලද යම් මුදලක් ඒ තැනැත්තාගෙන් අයකර ගත යුතුය. තවද, ඒ එක් එක් අවස්ථාවේ දී ඒ තැනැත්තාගෙන් අය විය යුතු මුදල සහතික කොට තම නිර්ණය ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත දන්වා යැවිය යුතුය.

(ආ) යම් තැනැත්තකුට යම් ඉඩදීමක් නොකිරීමට හෝ යම් අධිභාරයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ සාමාන්‍ය හෝ විශේෂ නියෝගයකින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් සුදුසු යැයි සිතිය හැකි යම් කරුණු සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හෝ යම් කරුණු ඉදිරිපත් කිරීමට ඒ තැනැත්තාට ඔහු විසින් අවස්ථාවක් දිය යුතු අතර එවැනි ඉඩ නොදීමක් හෝ අධිභාර කිරීමක් කරනු ලැබුව හොත් රෙජිස්ට්‍රාර්ගේ හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ තීරණය සඳහා හේතු ඉල්ලා ඔහු වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමෙන් පසු ඒ ඉඩ නොදීම හෝ අධිභාර කිරීම සම්බන්ධයෙන් තම තීරණයේ හේතු ලියවිල්ලකින් ඒ තැනැත්තා වෙත සැපයිය යුතුය.

(ඇ) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද තීරණයට අනුකූලව ක්‍රියා නොකරන ලද අවස්ථාවක 66 (2) වැනි වගන්තියේ විධි විධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

45. (1) ලියාපදිංචි කළ සමිතියක ක්‍රියාකාරිත්වයෙහි යම් අඩුපාඩු 44 වන වගන්තිය යටතේ කරන ලද විගණනයක දී එළිදරව් වුවහොත්, රෙජිස්ට්‍රාර් විසින් ඒ අඩුපාඩු සමිතියේ දැන ගැනීමට හා ඒ සමිතිය අන් සමිතියක සාමාජිකයෙකු නම් ඒ අන් සමිතියේ දැන ගැනීමට ද සැලැස්විය යුතුය. විගණනයෙහි සම්බි වෙන ද

(2) රෙජිස්ට්‍රාර් විසින්, එළිදරව් අඩුපාඩු සම්බන්ධයෙන් පිළියම් යෙදීම සඳහා නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පියවරක් ඒ නියෝගයෙහි සඳහන් කාලය ඇතුළත දී ගන්නා ලෙස සමිතියට හෝ එහි නිලධරයන්ට විධාන කෙරෙන නියෝගයක් කළ හැකිය.

46. (1) ලියාපදිංචි කළ සමිතියක් පිහිටුවීම, එහි ක්‍රියාකාරිත්වය, හා මුදල් තත්ත්වය පිළිබඳ විභාගයක් පැවැත්වීම හෝ විභාගයකින් පවත්වන ලෙස ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් තමා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුටවිධාන කිරීමට රෙජිස්ට්‍රාර් විසින් තමාගේ ඕනෑකම පිට කළ හැකිය. තවද ඒ සමිතියේ කාරක සභාවේ වැඩි දෙනෙකු හෝ සමිතියේ සාමාජිකයින්ගෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවක් විසින් ඉල්ලා සිටි විට එසේ විභාග කිරීම හෝ විභාග කිරීමට විධාන කිරීම රෙජිස්ට්‍රාර් විසින් කළ යුතුය. විභාගය.

(2) (1) වන උප වගන්තිය යටතේ විභාගයක කාර්යය සඳහා රෙජිස්ට්‍රාර්ට හෝ විභාගයක් පවත්වන ලෙස ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට-

(අ) රෙජිස්ට්‍රාර්ගේ හෝ විභාග කිරීම සඳහා ඔහු විසින් බලය පවරනු ලැබූ තැනැත්තාගේ මතය අනුව සමිතියේ යම් ගනුදෙනුවක් හෝ එහි කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය සම්බන්ධයෙන් වැදගත් තොරතුරු සැපයිය හැකි සමිතියේ කලින් සිටි හෝ දැනට සිටින නිලධරයකු, නියෝජිතයකු, සේවකයකු හෝ සාමාජිකයකු හෝ වෙනයම් තැනැත්තකු කැඳවීමේ,

(ආ) සමිතියේ කටයුතුවලට අදාළ යම් පොතක් හෝ ලේඛනයක්, හෝ සමිතියට යම් මුදලක්, සුරැකුම් පතක් හෝ වෙනත් දේපලක් ඉදිරිපත් කරන ලෙස එය සන්තකව හෝ භාරව සිටින, කලින් සිටි හෝ දැනට සිටින සමිතියේ නිලධරයකුට, නියෝජිතයකුට සේවකයකුට හෝ සාමාජිකයකුට හෝ වෙනයම් තැනැත්තකුට නියම කිරීමේ,

(ඇ) තමා විසින් විධාන කළ හැකි යම් කරුණු නිශ්චිත කිරීම සඳහා සමිතියේ සාමාජිකයන්ගේ මහා සභා රැස්වීමක් තමා විසින් නිශ්චිතව සඳහන් කළ හැකි යම් වේලාවක දී හා ස්ථානයක දී කැඳවීමේ , හා

(ඈ) වංචාවක් හෝ අක්‍රමිකතාවන් සිබෙන බවට විශ්වාස කිරීමට ඒ විභාගය පවත්වන අතරතුර දී ඔහුට හේතු ඇති අවස්ථාවක සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමේ බලය තිබිය යුතුය.

(3) (2) (ඇ) වැනි වගන්තිය යටතේ කැඳවනු ලබන යම් රැස්වීමකට සමිතියේ අතුරු ව්‍යවස්ථා යටතේ කැඳවනු ලබන මහා සභා රැස්වීමකට සියලු බලතල තිබිය යුතුය. තවද ඒ රැස්වීම සඳහා ගණපූරණය තිබිය යුතු නොවීමේ හා මහා සභා රැස්වීමක් කැඳවීමේ දැන්වීමෙහි කාල සීමාව පිළිබඳව අතුරු ව්‍යවස්ථාවල ඇති විධි විධාන එම රැස්වීමට අදාළ නොවිය යුතු වීමේ විශේෂය හැර ඒ අතුරු ව්‍යවස්ථාවලින් එකී කටයුතු විධිමත් කරනු ලැබිය යුතුය. රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරිය හැකි නමුදු ඔහුට ඡන්දයක් නොතිබිය යුතුය. ඡන්දය සමානව බෙදී ගියහොත් ඔහුට තීරක ඡන්දයක් තිබිය යුතුය.

(4) මේ වගන්තිය යටතේ විභාගයන් පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් ඒ විභාගයේ ප්‍රතිඵලය සමිතිය වෙත හා ඒ සමිතිය සාමාජිකයෙකු වන අන් සමිතියක් ඇතහොත් ඒ සමිතිය වෙත ද සමිතිය යම්කිසි බැංකුවකට ණයවී ඇත්නම් ඒ බැංකුව වෙතද දැන්විය යුතුය.

(5) රෙජිස්ට්‍රාර් හා මේ වගන්ති යටතේ විභාගයක් පවත්වන ලෙස ඔහු විසින් බලය පවරනු ලැබූ සැම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයේ අදහස් අනුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සළකනු ලැබිය යුතුය.

47. (1) රෙජිස්ට්‍රාර් විසින් තමාගේ ඕනෑකම පිට හෝ ලියාපදිංචි කළ සමිතියක ණය හිමියකුගේ ඉල්ලීම පිට ඒ සමිතියේ පොත් පරීක්ෂා කළ හැකිය. නැතහොත් ඒ වෙනුවෙන් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් ඔහු විසින් සාමාන්‍යයෙන් හෝ විශේෂයෙන් බලය පවරනු ලබන යම් තැනැත්තකුට ඒ පොත් පරීක්ෂා කරන ලෙස විධාන කළ හැකිය. සමිතියක පො පරීක්ෂා කිරී එහි කටයුතු විමර්ශනය

එසේ වුවද ඉල්ලුම්කරු විසින් -

(අ) යම් නිශ්චිත මුදලක් ඔහුට ලැබිය යුතු බවත් ඔහු එය ගෙවන ලෙස ඉල්ලා ඇති බවත් සාධාරණ කාලයක් ඇතුළත දී ඔහුට එය ලැබී නැති බවත් ඔප්පු කරනහොත්, හා

(ආ) යෝජිත පරීක්ෂණයේ වියදම් සඳහා රෙජිස්ට්‍රාර් විසින් නියම කළහැකි යම් මුදලක් ඇප වශයෙන් රෙජිස්ට්‍රාර් වෙත තැන්පත් කරනහොත්

මිස, ණය හිමියකුගේ ඉල්ලීම පිට එවැනි කිසිම පරීක්ෂණයක් නොපැවැත්විය යුතුය.

(2) රෙජිස්ට්‍රාර් විසින් ස්වකීය ඕනෑකම පිට යම් ලියාපදිංචි කළ සමිතියක කටයුතු විමර්ශණය කළ හැකිය. නැතහොත් ඔහු විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට එසේ විමර්ශණය කරන ලෙස විධාන කළ හැකිය.

(3) රෙජිස්ට්‍රාර් හෝ මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට -

(අ) ලියාපදිංචි කළ සමිතියක සියලුම පොත්, ගිණුම් ලියකියවිලි හා සුරැකුම්පත් සෝදිසිකර බැලීමට සෑම විටම ඉඩකඩ තිබිය යුතු අතර එසේ ඉහත කී දේ පරීක්ෂාකර බැලීමට හිමිකම් තිබිය යුතුය, තවද පරීක්ෂණයක් හෝ විමර්ශනයක් පවත්වන තැනැත්තාට අවශ්‍ය විය හැකි සමිතියේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ යම් තොරතුරු සමිතියේ සෑම නිලධරයකු හෝ සාමාජිකයකු විසින්ම සැපයිය යුතුය, තවද

(ආ) ඒ පරීක්ෂණයේ දී හෝ විමර්ශණයේ දී තමා විසින් වංචාවන් සොයාගනු ලබන අවස්ථාවක ඒ සමිතියේ ගණන් පොත් හෝ ලේඛණ තම භාරයට ගැනීමේ බලය තිබිය යුතුය.

(4) එවැනි යම් පරීක්ෂණයක ප්‍රතිඵල -

(අ) රෙජිස්ට්‍රාර්ගේ ඕනෑකම පිට ඒ පරීක්ෂණය පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් සමිතිය වෙත ද සමිතිය යම්කිසි බැංකුවකට ණයවී ඇත්නම් ඒ බැංකුව වෙත ද දැන්විය හැකිය. තවද,

(ආ) ණය හිමියකුගේ ඉල්ලීම පිට ඒ පරීක්ෂණය පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් ණය හිමියා වෙත හා සමිතිය වෙත දැන්විය යුතුය.

(5) ලියාපදිංචි කළ සමිතියක ණය හිමියකුගේ ඉල්ලීම පිට (1) වැනි උප වගන්තිය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලැබූ අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි සිතන පරිදි ඒ පරීක්ෂණයේ ගාස්තු හෝ ඒ ගාස්තුවල යම් කොටසක් සමිතිය හා ණය හිමියා අතර බෙදිය හැකිය.

(6) යම් සමිතියක් හෝ ණය හිමියකු සම්බන්ධයෙන් මේ වගන්තිය යටතේ ගාස්තු වශයෙන් ප්‍රදානය කරනු ලැබූ යම් මුදලක් ඒ සමිතියේ ලියාපදිංචි කළ කාර්යාලය පිහිටි හෝ ණය හිමියා පදිංචිව සිටින ස්ථානය පිළිබඳව අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉල්ලුම් කරනු ලැබූ විට ඒ අධිකරණය විසින් පවත්වනු ලැබූ දඩයක් අයකර ගන්නා ආකාරයෙන් අයකර ගනු ලැබිය හැකිය.

(7) රෙජිස්ට්‍රාර් හා ලියාපදිංචි කළ සමිතියක පොත් පරීක්ෂා කිරීමට හෝ කටයුතු විමර්ශණය කිරීමට ඔහු විසින් බලය පවරනු ලැබූ සෑම තැනැත්තකුම දණ්ඩ නීති සංග්‍රහයෙහි අර්ථානුකූලව රාජ්‍ය සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

(8) මේ වගන්තියේ විධි විධාන යටතේ පරීක්ෂණයක හෝ විමර්ශණයක කාර්ය සඳහා, රෙජිස්ට්‍රාර්වරයාට හෝ ඔහු විසින් පරීක්ෂණය හෝ විමර්ශණය පැවැත්වීම සඳහා බලය දෙන ලද යම් තැනැත්තකුට -

(අ) සමිතියේ ගනුදෙනු කිසිවක් පිළිබඳව හෝ එහි කටයුතු පාලනය කිරීම සම්බන්ධයෙන් හෝ වැදගත්ම තොරතුරු සැපයිය හැකි යයි රෙජිස්ට්‍රාර් වරයා හෝ පරීක්ෂණය පැවැත්වීමට ඔහු විසින් බලය දෙන ලද තැනැත්තා හෝ අදහස් කරන, සමිතියේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධරයෙකු, අනු යෝජිතයෙකු, සේවකයෙකු හෝ සාමාජිකයෙකු නැතහොත් වෙනත් යම් තැනැත්තකු කැඳවීමට,

(ආ) සමිතියේ කටයුතු වලට අදාළ යම් පොතක, ලේඛණයක, මුදලක, ඇපයක හෝ වෙනත් දේපළක සන්තකය නැතහොත් භාරය දරන සමිතියේ කලින් සිටියා වූ හෝ දැනට සිටින්නා වූ නිලධරයෙකුට අනුයෝජිතයෙකුට, සේවකයෙකුට, සාමාජිකයෙකුට හෝ වෙනත් තැනැත්තකුට ඒවා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට, තමා විසින් විධාන කරනු ලබන කාරණා තීරණය කිරීම පිණිස,

(ඇ) තමා විසින් නිශ්චය කරනු ලබන වේලාවක සහ ස්ථානයක සමිතියේ සාමාජිකයින්ගේ මහා සභා රැස්වීමක් කැඳවීමට, සහ

(ඈ) වංචාක් හෝ අක්‍රමිකතාවක් හෝ සිදුවන බවට එවැනි පරීක්ෂණයක දී හෝ විමර්ශණයක දී විශ්වාස කිරීමට ඔහුට හේතු ඇති අවස්ථාවක, සමිතියේ ගිණුම් පොත් හෝ ලේඛන තම භාරයට ගැනීමට,

බලය තිබිය යුතුයි.

## VIII වැනි පරිච්ඡේදය

### ලියාපදිංචි කළ සමිතියක නිලධරයන්ගේ සේවය අත්හිටුවීමට හෝ වැඩ තහනම් කිරීම හා නිලධරයන් ඉවත් කිරීම සහ ලියාපදිංචි කළ සමිතියක කාරක සභාව විසුරුවා හැරීම

සමිතියක කාරක සභාව විසුරුවා හැරීම.

48. (1) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශනයකින් හෝ පසු, ලියාපදිංචි කළ යම් සමිතියක කාරක සභාව එහි යුතුකම් නිසි ආකාරයෙන් ඉටු නොකරන බව රෙජිස්ට්‍රාර් වරයාගේ මතය වුවහොත්, කාරක සභාව විසුරුවා හැරීම සම්බන්ධයෙන් එහි විරෝධතා කිසිවක් වෙතොත් ඒ විරෝධතා ප්‍රකාශ කරනු පිණිස ඔහු විසින් කාරක සභාවට අවස්ථාවක් දීමෙන් පසු සහ ඔහු විසින් කැඳවනු ලැබූ සමිතියේ මහා සභා රැස්වීමක දී ඒ විරෝධතා සලකා බැලීමෙන් පසු ලියවිල්ලකින් වූ නියෝගයක් මඟින් –

(අ) කාරක සභාව විසුරුවා හරිනු ලැබිය හැකිය; තවද

(ආ) මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි පත් කරනු ලබන සුදුසු තැනැත්තකු හෝ තැනැත්තන් විසින් සමිතියේ කටයුතු කළමණාකරණය හා පරිපාලනය කළයුතු යැයි විධාන කරනු ලැබිය හැකිය.

(2) (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන සෑම විධානයක්ම ඒ විධානය අන්තර්ගත වියහැකි නියෝගයෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි අවුරුදු දෙකකට නොවැඩි කාල පරිච්ඡේදයක් තුළ බලපැවැත්විය යුතුය.

එසේ වුවද රෙජිස්ට්‍රාර් විසින් තම අභිමතය පරිදි කලින් කල ඒ විධානය බල පැවැත්විය යුතු කාල පරිච්ඡේදය දීර්ඝ කිරීමේ කාර්යය සඳහා ඒ ආඥාව සංශෝධනය කළ හැකි නමුදු ඒ විධානය එසේ බල පැවැත්විය යුතු මුළු කාල පරිච්ඡේදය අවුරුදු හතරකට වැඩි නොවිය යුතුය.

(3) රෙජිස්ට්‍රාර් විසින් (1) වන උප වගන්තිය යටතේ යම් නියෝගයක් කරනු ලැබූ අවස්ථාවක, ඒ නියෝගයෙන්ම හෝ පසුව වූ නියෝගයකින් ඒ සමිතියේ කටයුතු පාලනය හා පරිපාලනය කිරීමට සුදුසු හා නිසි තැනැත්තකු හෝ තැනැත්තන් දෙදෙනෙකු හෝ ඊට වැඩි ගණනක් පත් කළ යුතු අතර, එසේ පත්කරනු ලැබූ යම් තැනැත්තකු කලින් කල ඉවත් කිරීම හෝ ඔහු වෙනුවට වෙන තැනැත්තකු පත්කිරීම හෝ අතිරේක තැනැත්තන් පත් කිරීම කළ හැකිය.

(4) රෙජිස්ට්‍රාර්ගේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව, ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට –

(අ) සමිතියේ වත්කම් අයකර ගැනීමේ හා බැදීම් ඉටු කිරීමේ ද එහි යහපත සඳහා අවශ්‍ය වියහැකි වෙන යම් පියවරවල් ගැනීමේ ද බලය තිබිය යුතුය, තවද,

(ආ) සමිතියේ යථා පරිදි සංස්ථාපනයක් කරන ලද කාරක සභාවේ සියලු බලතල, අයිතිවාසිකම් හා වරප්‍රසාද තිබිය යුතු අතර ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය. තවද ඒ සමිතියේ කටයුතු කාර්යක්ෂම ලෙස කළමණාකරණය කිරීම උදෙසා අවශ්‍ය වන අවස්ථාවක මහා මණ්ඩලය සතු බලතල අතුරින් එසේ අවශ්‍ය වන බලතල ද, ඒ මහා මණ්ඩලය බැහැර කෙරෙන පරිදි තිබිය යුතු අතර, ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය ; තවද

(5) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබූ තැනැත්තන් විසින් නීතියට හෝ ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට පටහැනිව කරන ලද යම් ක්‍රියා නිසා විඳීමට සිදුවූ යම් පාඩුවක් සඳහා ඔවුන් සාමූහිකව හා වෙන් වෙන්ව වගකිව යුතුය.

(6) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත් කරන ලද යම් තැනැත්තකුට හෝ තැනැත්තන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ඔහු විසින් නියම කළ හැකිය. ඒ පාරිශ්‍රමිකය හා ඒ සමිතියේ කළමණාකාරිත්වයෙහිලා දරන්නට සිදුවන වෙනත් වියදම් ඇතොත් ඒ වියදම් ද එහි මුදල්වලින් ගෙවිය යුතුය.

(7) ලියාපදිංචි කළ සමිතියක කටයුතු පාලනය කිරීම සඳහා මේ වගන්තිය යටතේ පත් කරනු ලැබ (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ වූ විධානය බල පැවැත්වීම නතර වන දිනයට පෙරාතුව වූ දිනයෙහි ධුරය දරමින් සිටින තැනැත්තා හෝ තැනැත්තන් විසින් එකී දිනයට පෙර සමිතියේ අතුරු ව්‍යවස්ථා අනුව අලුත් කාරක සභාවක් පත් කිරීමට කටයුතු පිළියෙල කිරීම ඔහුගේ හෝ ඔවුන්ගේ යුතුකම විය යුතුය.

(8) යම් ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් –

(අ) ඒ සමිතිය බැංකුවට ණය ගැතිව සිටී නම් කාරක සභාව විසුරුවා හැරීම හා ඒ සමිතියේ කටයුතු පාලනය හා පරිපාලනය කළයුතු තැනැත්තන් හා ආකාරය සම්බන්ධයෙන් කලින් ඒ බැංකුව විමසීමෙන් පසුව මිස ; හා

(ආ) ඒ සමිතිය සමුපකාර බැංකුවක් නම් මහජන බැංකුවේ පූර්ව අනුමැතිය ඇතිව මිස,

රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උපවගන්තිය යටතේ කිසිම නියෝගයක් නොකළ යුතුය.

(9) සමිතියේ ලියාපදිංචිය 49 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමට රෙජිස්ට්‍රාර් සතු බලය කොතරම් මේ වගන්තියේ කිසිවක් බලපාන ලෙස නොසැලකිය යුතුය.

(10) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයක් නැතහොත් විමර්ශණයක් නිම කිරීමට පෙර කාරක සභාවට විරුද්ධව මුල් බැල්මට චෝදනාවක් සනාථ වී ඇතැයි රෙජිස්ට්‍රාර්වරයාගේ මතය වේ නම් ඒ කාරක සභාව මාස හයක කාල සීමාවක් සඳහා අත්හිටුවීමට ද සමිතියේ වැඩ කටයුතු කළමණාකරනය කිරීම සහ පරිපාලනය කිරීම පිණිස අන්තර්කාලීන මණ්ඩලයක් පත්කිරීමට ද ඔහුට බලය තිබිය යුතුය. ඒ කාරක සභාව අත්හිටුවනු ලැබූ දින සිට මාස හයක කාල සීමාවක් ඇතුළත ඒ විභාගය හෝ විමර්ශණය රෙජිස්ට්‍රාර්වරයා විසින් නිම කළ යුතු අතර, ඒ කාරක සභාව (1) වැනි උප වගන්තිය යටතේ විසුරුවා හැරීම සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගනු ලැබිය යුතුය.

නිලධරයන්ගේ සේවය අත් හිටුවීම හෝ වැඩ තහනම් කිරීම හා නිලධරයන් ඉවත් කිරීම යනාදිය.

48 (අ) (i) (11) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් හෝ 47 වැනි වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් හෝ පසුව යම් ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයෙකු හෝ සේවානියුක්තයෙකු තම කාර්යය නිසි ආකාරයෙන් ඉටු නොකරන බව හෝ කාර්යක්ෂම ලෙස තම කාර්යය ඉටු කිරීමට නුසුදුසු බව නැතහොත් අන්‍යාකාරයකින් නොහැකි බව රෙජිස්ට්‍රාර් වරයාගේ මතය වුවහොත් මේ ප්‍රඥප්තියෙහි හෝ මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 14 දරන සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද සිය විරෝධතා දැක්වීමට එම නිලධරයාට හෝ සේවා නියුක්තයාට අවස්ථාවක් දීමෙන් පසුව අවශ්‍ය විභාගය අවසන් වනතුරු ඔහු විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවස්ථාවෝචිත පරිදි ඒ නිලධරයාගේ හෝ සේවානියුක්තයාගේ සේවය අත් හිටුවීම හෝ වැඩ තහනම් කිරීම කළ හැකි අතර ඒ විභාගයෙන් පසුව එම නිලධරයා හෝ සේවානියුක්තයා ධුරයෙන් ඉවත් කළ හැකිය.

එසේ වුවද මේ උප වගන්තිය යටතේ කරන ලද ඉවත් කිරීමේ නියෝගයකින් අතෘප්තියට පත් යම් සේවා නියුක්තයෙකු විසින් දින 30ක කාලයක් ඇතුළත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 14 දරන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද සමුපකාර සේවක කොමිෂන් සභාව වෙත එට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය. තව ද ඒ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක විය යුතු ය.

(02) (1) වැනි උප වගන්තිය යටතේ යම් නිලධරයෙකු හෝ සේවානියුක්තයෙකු ඉවත් කරනු ලැබ ඇත්තා වූ ද, ඒ ඉවත් කිරීමේ නියෝගය සමුපකාර සේවක කොමිෂන් සභාව විසින් ස්ථිර කොට ඇත්තා වූ නැතහොත් දින 30ක කාලයක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කර නොමැත්තාවූ ද අවස්ථාවක වෙනත් නිලධරයෙකු හෝ සේවානියුක්තයෙකු අවස්ථාවෝචිත පරිදි තෝරාපත්කර ගැනීම හෝ පත් කිරීම සම්බන්ධයෙන් අදාළ වන විධි විධාන අනුව කටයුතු ලැබිය හැකි ය.

## IX වන පරිච්ඡේදය

### *ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීම*

විසුරුවා හැරීම.

49. (1) 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් පසු හෝ 47 වන වගන්තිය යටතේ වූ පරීක්ෂණයකින් නැතහොත් විමර්ශණයකින් පසු ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයන්ගෙන් සතරෙන් තුන් කොටසක් විසින් එය විසුරුවා හැරීම සඳහා කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් පසු හා තම විරෝධතා ඉදිරිපත් කිරීමට සමිතියට සහ ඒ සමිතියේ ණය හිමියන්ට අවස්ථාවක් ලබාදීමෙන් පසු, ඒ සමිතිය විසුරුවා හැරිය යුතුයයි රෙජිස්ට්‍රාර්වරයා අදහස් කරයි නම්, ඔහු විසින් සම අත්සන යටතේ වූ නියෝගයක් මගින්, ඒ සමිතියේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) ලියාපදිංචි කළ සමිතියක යම් සාමාජිකයෙකු විසින් හෝ යම් ණයහිමියකු විසින් (1) වැනි උප වගන්තිය යටතේ වූ නියෝගයක දිනයේ සිට මාස දෙකක් ඇතුළත ඒ නියෝගයට විරුද්ධව මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත ආයාචනා කළ හැකිය.

(3) සමිතියක ලියාපදිංචිය අවලංගු කරමින් නියෝගයක් නිකුත් කිරීමේ දින සිට මාස දෙකක් ඇතුළත කිසිම ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ නියෝගය ඒ කාලය ගතවූ විට ක්‍රියාත්මක විය යුතුය. මාස දෙකක් ඇතුළත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක නියෝගය ස්ථිර කරනු ලබන තෙක් ඒ නියෝගය බල නොපැවැත්විය යුතුය.

(4) සමිතියක ලියාපදිංචිය රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උප වගන්තිය යටතේ අවලංගු කරනු ලබන අවස්ථාවක, සමිතියේ ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තෙක් හෝ ආයාචනයක දී මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් ඒ නියෝගය අවලංගු කරනු ලබන තෙක් සමිතියේ පොත්, ලේඛන හා වෙනත් දේපළ භාරව සිටීමට හා ඒ සමිතියේ කටයුතු පාලනය කිරීම සඳහා එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර් විසින් පත්කළ හැකිය.

ඒ තැනැත්තා හෝ තැනැත්තන් පත්කරනු ලැබූ විට සමිතියේ කාරක සභාව විසින් හෝ සමිතියේ පොත්, ලේඛන හා වෙනත් දේපළ භාරව සිටින වෙනයම් තැනැත්තෙකු විසින් ඒ පොත් ලේඛන හෝ දේපළ පළමු සඳහන් තැනැත්තා හෝ තැනැත්තන් වෙත භාරදිය යුතු අතර ලියාපදිංචිය අවලංගු කිරීමේ නියෝගය ක්‍රියාත්මක වන තුරු හෝ මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා විසින් ආයාචනයක දී ඒ නියෝග අවලංගු කරනු ලබන තෙක් ඒ කාරක සභාව අක්‍රිය විය යුතුය.

(50) යම් ලියාපදිංචි කළ සමිතියක් ලියාපදිංචිය -

(අ) සමිතිය යටත් පිරිසෙයින් සාමාජිකයන් දහ දෙනෙකුගෙන්වත් සමන්විත විය යුතුබව ඒ සමිතිය ලියාපදිංචි කිරීමේ කොන්දේසියක් වන අවස්ථාවක ඒ සමිතියේ සාමාජික සංඛ්‍යාව දහයකට අඩුවී ඇත්නම්, හෝ සමිතියක ලියා... අවලංගු කිරීම

(ආ) සමිතිය ලියාපදිංචි කළ දින සිට අවුරුදු එකක කාල පරිච්ඡේදයක් තුළ ඒ ලියාපදිංචි කළ සමිතිය වැඩ ආරම්භ කොට නැත්නම් හෝ මේ වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝගය පැනවීමේ දිනයට පෙර අවුරුදු දෙකක කාල පරිච්ඡේදයක් තුළ අක්‍රියව තිබුනේ නම් රෙජිස්ට්‍රාර් විසින් ලියවිල්ලකින් වූ නියෝගයක් මගින් අවලංගු කළ හැකිය.

51. ලියාපදිංචි කළ සමිතියක ලියාපදිංචිය 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ වූ නියෝගයකින් අවලංගු කරනු ලැබූ අවස්ථාවක මෙහි මින් මතු විස්තරවා හැරීමේ දිනය වශයෙන් සඳහන් කෙරෙන ඒ නියෝගය ක්‍රියාත්මක වන දින සිට ඒ සමිතිය සංස්ථාවක් ලෙස පැවතීම නතර විය යුතුය. ලියාපදිංචිය අ... කිරීමේ බලපෑ...

එසේ වුවද මේ ප්‍රඥප්තියෙන් හෝ මේ ප්‍රඥප්තිය යටතේ සමිතිය වෙත පැවරුණු යම් වර ප්‍රසාද රෙජිස්ට්‍රාර් විසින් සමිතිය සඳහා පත්කරනු ලැබූ යම් ඈවරකරුවකු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

52. 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ සමිතියක් ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ අවස්ථාවක ඒ සමිතියේ ඈවරකරු හෝ ඈවරකරුවන් වශයෙන් එක් තැනැත්තකු හෝ තැනැත්තන් වැඩි ගණනක් රෙජිස්ට්‍රාර් විසින් පත් කළ හැකිය. සමිතිය ලියාපදිං... අවලංගු කිරීමේ... ඈවර කිරීම.

අවස්ථාවෝචිත පරිදි 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ අවලංගු කිරීමේ නියෝග ක්‍රියාත්මක වන දිනයේ සමිතියේ සියලුම දේපල ඈවරකරු හෝ ඈවරකරුවන් වෙත පවරනු ලැබිය යුතුය.

53. (1) 52 වැනි වගන්තිය යටතේ පත්කරන ලද ඈවරකරුට රෙජිස්ට්‍රාර්ගේ මග පෙන්වීම හා පාලනයට හා 54 වැනි වගන්තිය යටතේ වූ නියෝගයන් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන යම් සීමාකිරීම්වලට යටත්ව, පහත සඳහන් කටයුතු කිරීමේ බලය තිබිය යුතුය - ඈවරකරුගේ බ...

(අ) සමිතියේ වත්කම්වලට සමිතියේ සාමාජිකයන් හා හිටපු සාමාජිකයන් විසින් ගෙවිය යුතු හෝ සමිතියේ මියගිය සාමාජිකයන්ගේ බූදල්වලින් ලැබිය යුතු දායක මුදල් කලින් කල නිශ්චය කිරීම ;

(ආ) හිමිකම් කියාපෑම් සමිතියේ පොත්වල එතෙක් සටහන්ව් නැති ණයහිමියන් විසින් සිය හිමිකම් කියාපෑම් ඇතුළත් කරවා ගැනීම සඳහා ඒවා ඉදිරිපත්කළ යුත්තේ හෝ ඒ හිමිකම් කියාපෑම් ඔවුන් විසින් තහවුරු කරනු ලැබීමට පෙර කෙරෙන වත්කම් බෙද දීමෙන් ඒ ණයහිමියන් අත්හරිනු ලැබිය යුත්තේ යම් දිනයකට පෙර ද ඒ දිනය ප්‍රකාශණයකින් හෝ දැන්වීමකින් නියම කිරීම.

(ඇ) ණය හිමියන් අතර උද්ගත වන ප්‍රමුඛත්වය පිළිබඳව යම් ප්‍රශ්නයක් මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව තීරණය කිරීම ;

(ඈ) 58 වැනි වගන්තියෙහි සඳහන් යම් විස්තරයක යම් ආරවුලක් (සමිතිය සම්බන්ධයෙන් එහිවූ සඳහන් කිරීම් ඈවරකරු සම්බන්ධයෙන්වූ සඳහන් කිරීම් ලෙස තේරුම් ගෙන) ඒ වගන්ති යටතේ තේරුම් කිරීම සඳහා යොමු කිරීම හා සමිතිය වෙනුවෙන් තමාගේ නමින් හෝ ධුරයෙන් සිවිල් නඩු හා වෙනත් නීති පැවරීම හා නීති කෘත්‍යවල දී ප්‍රතිවාද ඉදිරිපත් කිරීම.

(ඉ) ඈවරකිරීමේ ගාස්තු කවර පුද්ගලයන් විසින් හා කවර ප්‍රමාණවලින් දැරිය යුතු ද යන්න තීරණය කිරීම ;

(ඊ) සමිතිය ගණන් බේරා වසා දැමීමේ දී අවශ්‍ය වියහැකි වත්කම් එකතු කොට බෙදාදීම සම්බන්ධයෙන් විධාන කිරීම ;

(උ) රෙජිස්ට්‍රාර්ගේ අනුමැතිය කලින් ලැබ ඇත්තේ නම් සමිතිය විසින් හෝ සමිතියට විරුද්ධව ඉදිරිපත් කරණු ලැබූ හිමිකම් කියාපෑම් සමථයකට පත්කිරීම.

(ඌ) ඈවර කිරීම නිසිලෙස පැවත්වීම සඳහා අවශ්‍ය විය හැකි සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම කැඳවීම ;

(එ) සමිතියේ පොත් ලේඛන හා වත්කම් තම සන්තකයට ගැනීම ;

(ඒ) සමිතියේ දේපල විකිණීම ;

(ඔ) වැඩදායි ලෙස ගණන් බේරා වසා දැමීම සඳහා අවශ්‍ය විය හැකි තාක් දුරට සමිතියේ කටයුතු පවත්වාගෙන යාම එසේ වුවද ණය දෙන සමිතියක ඈවරකරුට යම් ණය මුදල් නිකුත් කිරීම සඳහා මෙහි අඩංගු කිසිවකින් හිමිකම් නොලැබිය යුතුය. තවද,

(ඕ) රෙජිස්ට්‍රාර් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමයක් අනුමත කරනු ලැබූ විට සමිතියේ වත්කම් පහසු ආකාරයකින් බෙදාදීම සඳහා කටයුතු පිළියෙල කිරීම.

(2) 49 වැනි වගන්තිය හෝ 50 වැනි වගන්තිය යටතේ ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක යම් සාමාජිකයෙකු හෝ කලින් සිටි සාමාජිකයෙකු විසින් යම් ණයක් ගෙවීමට ඇති හා ඒ තැනැත්තා ඒ අවලංගු කිරීමේ දිනයෙන් පසු මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ අන් කිසි සමිතියක සාමාජිකයෙකු වන අවස්ථාවක.

52 වැනි වගන්තිය යටතේ පත් කරන ලද පළමු සඳහන් සමිතියේ ඈවරකරුට රෙජිස්ට්‍රාර්ගේ මඟ පෙන්වීම හා පාලනයට සහ 54 වැනි වගන්තිය යටතේ වූ නියෝගයක් මගින් රෙජිස්ට්‍රාර් විසින් නියම කරනු ලබන වෙන යම් සීමාකිරීම්වලට ද යටත්ව ඒ කැනැත්තාට ඒ අන් සමිතියෙන් අය විය යුතු මුදලෙන් ඒ ණයට වැඩි නොවන මුදලක් ඒ සාමාජිකයාගෙන් ඒ අන් සමිතියට අයවිය යුතු ණයක් වූවාක් මෙන් අය කොට ඒ මුදල ඈවරකරු වෙත යවන ලෙස ඒ අන් සමිතියට නියම කිරීමේ බලය තිබිය යුතුය.

(3) මේ ප්‍රඥප්තිය යටතේ පත් කරන ලද යම් ඈවරකරුවෙකුට ඒ වෙනුවෙන් සාදනු ලැබිය හැකි රීතිවලට යටත්ව මේ වගන්තියේ කාර්යයන් කර ගෙන යාම පිණිස යම් බලතල අවශ්‍ය වන ප්‍රමාණයට, දිසා අධිකරණයක් සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ විධිවිධාන සලස්වා ඇති මාර්ගයෙන්ම හා (අවශ්‍ය විය හැකි පමණින්) ඒ ආකාරයටම පාර්ශවකරුවන් හා සාක්ෂිකරුවන් කැඳවීමට හා පැමිණ සිටීමට ඔවුන්ට බල කිරීමටත්, ලේඛන ඉදිරිපත් කරන ලෙස ඔවුන්ට බල කිරීමටත් බලය තිබිය යුතුය.

ඈවර කිරීම පාලනය කිරීමට රෙජිස්ට්‍රාර් සතු බලය.

54 ඈවරකරු රෙජිස්ට්‍රාර්ගේ පාලනයට හා විධානයට යටත්ව සිය බලතල ක්‍රියාවේ යෙදවිය යුතු අතර,

(අ) ඈවරකරුවෙකු විසින් කරනු ලබන යම් නියෝගයක් පරිච්ඡින්න කොට හෝ වෙනස් කොට අවශ්‍ය කවර හෝ අලුත් නියෝගයක් කිරීමට ද ;
(ආ) ඈවරකරුවකු ධූරයෙන් ඉවත් කිරීම ද ;
(ඇ) සමිතියේ සියලුම පොත්, ලේඛන හා වත්කම් ඉදිරිපත් කරන ලෙස නියම කිරීම ද ;
(ඈ) 53 වගන්තිය යටතේ වූ ඈවරකරුවෙකුගේ බලතල ලියවිල්ලකින් වූ නියෝගයකින් සීමා කිරීම ද ;
(ඉ) ගණන් ඉදිරිපත් කරන ලෙස ඈවරකරුට තම අභිමතය පරිදි නියම කිරීමට ද ;
(ඊ) ඈවරකරුගේ ගණන් විගණනය කරවා ගැනීම හා සමිතියේ වත්කම් බෙදීමට බලය පැවරීම ද ;
(උ) ඈවරකරුට පාරිශ්‍රමික ගෙවීමට නියෝග කිරීම ; හෝ
(ඌ) ඈවරකරු හා යම් තැනිය පාර්ශවකරුවෙකු හා අතර පවතින්නාවූ 53(1) (ඇ) වැනි වගන්තිය යටතේ බේරුම් කිරීමට යොමු කළ හැකි ආරවුලක් නොවන) යම් ආරවුලක් ඒ පිළිබඳව බේරුම්කරු දෙන තීරණයෙන් බැඳී සිටීමට ඒ පාර්ශවකරු ලියවිල්ලකින් කැමැත්ත ප්‍රකාශ කරතහොත් බේරුම් කිරීම සඳහා යොමු කිරීම ද, රෙජිස්ට්‍රාර් විසින් කළ හැකිය.

නියෝග ක්‍රියාත්මක කිරීම.

55. (1) 54 වැනි වගන්තිය යටතේ තමා වෙත යොමු කරනු ලැබූ යම් කරුණක් සම්බන්ධයෙන් වූ බේරුම්කරුගේ තීරණයෙන් පාර්ශවකරුවන් බැඳී සිටිය යුතු අතර, ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ නියෝගයක් ක්‍රියාත්මක කරන ආකාරයට ඒ තීරණය ක්‍රියාත්මක කළ හැකි විය යුතුය.

(2) බේරුම්කරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වැනි වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ කරනු ලැබූ නියෝගයක් කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු අතර, ඒ සමිතියේ ලියාපදිංචි කරන ලද කාර්යාලය පිහිටි ස්ථානය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති යම් සිවිල් අධිකරණයක් විසින් ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ක්‍රියාත්මක කරන ආකාරයෙන් ඒ නියෝගය ක්‍රියාත්මක කළ යුතුය.

එසේ වුවද ලියාපදිංචිය අවලංගු කරනු ලැබූ සමිතියක ණය හිමියකු වන යම් බැංකුවකට, යම් ඈවරකරුවෙකු හෝ රෙජිස්ට්‍රාර් විසින් 53 වැනි වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ කරන ලද නියෝගයකට විරුද්ධව ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගයේ දිනයේ සිට මාස දෙකක් ඇතුළත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත ආයාචනා කිරීමට හිමිකම් තිබිය යුතුය.

(3) 53 වැනි වගන්තිය හෝ 54 වැනි වගන්තිය යටතේ ඈවරකරුවෙකු විසින් හෝ රෙජිස්ට්‍රාර්වරයෙකු විසින් නියෝගයක් කිරීමෙන් පසු මාස දෙකක් ඇතුළත මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත කිසිම ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක ඒ ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ එම නියෝගය එම කාල පරිච්ඡේදය ගතවීමෙන් පසු බල පැවැත්විය යුතුය. මාස දෙකක් ඇතුළත් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂයභාර අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක අමාත්‍යවරයා විසින් ස්ථිර කරනු ලබන තෙක් ඈවරකරුගේ හෝ රෙජිස්ට්‍රාර්ගේ නියෝගය බල නොපැවැත්විය යුතුය.

සිවිල් අධිකරණයක අධිකරණ බලය සීමා කිරීම.

56. මෙහි පෙරාතුව ප්‍රකාශිතවම විධිවිධාන සැලසුණු ප්‍රමාණයට හැර මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කළ සමිතියක් විසුරුවා හැරීමට අදාළ යම් කරුණක් සම්බන්ධයෙන් කිසිම සිවිල් අධිකරණයකට කිසිම අධිකරණ බලයක් නොතිබිය යුතුය.

ඈවර කිරීම අවසන් කිරීම.

57. (1) ලියාපදිංචි අවලංගු කරන ලද සමිතියක් ඈවර කිරීමේ දී සංචිත අරමුදල ඇතුළු අරමුදල් 40(2) වැනි වගන්තියේ විධි විධානවලට යටත්ව ප්‍රථම කොට ඈවර කිරීමේ ගාස්තුව සඳහා ද, රජයට ආණ්ඩුවේ ණය, ආණ්ඩුව ඇප වූ ණය හා පළාත් සභාවේ ණය හා පළාත් සභාව ඇප වූ ණය ආපසු ගෙවීම සඳහා ද, ඉක්බිතිව සමිතියේ වෙනත් වගකීම් ඉටු කිරීම පිණිස ද ඉක්බිතිව කොටස් ප්‍රාග්ධන ගෙවීම පිණිස ද, ඉනික්බිතිව සමිතියේ අතුරු ව්‍යවස්ථාවලින් අවසර ලැබෙන්නේ නම්, ලාභ බෙදනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් සඳහා අවුරුද්දකට සියයට හයකට නොවැඩි ප්‍රමාණයකින් ලාභාංශයක් ගෙවීම සඳහා ද, ලාභ පිළිබඳව පුදුස්සක් කරනු නොලැබූ යම් කාල පරිච්ඡේදයක් වෙනුවෙන්, ඊ කාල පරිච්ඡේදය විසුරුවා හැරීමේ දිනයට පෙරාතුවම වූ අවස්ථාවක හා සාමාජිකයන්ට ප්‍රතිදානයක් ගෙවීම සඳහා ද යෙදිය යුතු ය.

(2) සමිතියක ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා ඒ සමිතියේ යම් ණය හිමියකු විසින්, වත්කම් බෙදා දීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියා පැමක් ඉදිරිපත් කරනු නොලැබූ හෝ ඒ දෙය ඔහුට නොලැබුණු විට ඈවර කිරීම අවසන් කිරීමේ දිනයේ සිට [illegible] පළ කළ යුතු ය. තවද ඒ සමිතියේ අරමුදල් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් කියා පැමක් [illegible] ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට මාස තුනක් ඇතුළත ආරම්භ වන්නේ නම් මිස පවත්වා[illegible] යුතු ය.

(3) (1) වැනි [illegible] සඳහා සහ (2) වැනි උප වගන්තිය යටතේ නඩුවක් පවරනු ලැබූ යම් හිමිකම් කියා පෑම් ගෙවීම සඳහා මුදල් යෙදීමෙන් පසු ඉතිරි වන යම් අතිරික්තයන් ඒ සමිතිය විසුරුවා හැරීමේ දිනයෙහි එහි [illegible] රෙජිස්ට්‍රාර් ගේ අනුමැතියට යටත්ව තෝරාගත හැකි යම් ප්‍රාදේශීය හෝ මහජනෝපකාර අරමුදලක් සඳහා යෙදිය හැකිය.

සමිතිය ඈවර කිරීමේ දිනයෙන් පසු [illegible] ඇතුළත රෙජිස්ට්‍රාර් විසින් අනුමත කරනු ලැබූ ඉහත කී අරමුදලක් තෝරා ගැනීම ඒ තැනැත්තන් [illegible] රෙජිස්ට්‍රාර් විසින් අතිරික්තය බැංකුවක හෝ ලියාපදිංචි කළ සමිතියක තැන්පත් කළ යුතු ය.

එසේ තැන්පත් කළ අතිරික්තය මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා පිහිටුවනු ලැබිය හැකි අතිරික්ත අරමුදලකට ගෙවනු ලැබිය හැකිය. රීතිවලින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි යම් කාර්යයන් සඳහා එසේ විධිවිධාන සලස්වනු ලැබිය හැකි ආකාරයකින් ඒ අතිරික්ත අරමුදලින් මුදල් වියදම් කිරීම රෙජිස්ට්‍රාර්ගේ අභිමතය පරිදි කළ හැකිය.

එසේ වුවද අතිරික්තයට එකතුවන යම් පොළියක් සමූපකාර අරමුදලට ගෙවනු ලැබිය හැකිය.

## X වැනි පරිච්ඡේදය

### ආරවුල්

58. (1) ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයකට සම්බන්ධ යම් ආරවුලක් - ආරවුල් සමථයට පත් කිරීම

(අ) සාමාජිකයන්, හිටපු සාමාජිකයන් සහ සාමාජිකයන් හිටපු සාමාජිකයන් හා මියගිය සාමාජිකයන් මගින් හිමිකම් කියා පාන තැනැත්තන් අතර, හෝ සමිතියේ අතීත හෝ වර්තමාන නිලධරයන් හෝ සේවකයන් අතර, හෝ මියගිය නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ උරුමකරුවන්ගේ හෝ නීත්‍යානුකූල නියෝජිතයන් අතර ; හෝ

(ආ) සාමාජිකයකු, හිටපු සාමාජිකයකු හෝ සාමාජිකයකු, හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන තැනැත්තෙකු හා සමිතිය, එහි කාරක සභාව හෝ එහි අතීත හෝ වර්තමාන යම් නිලධරයකු හෝ සේවකයකු හෝ මියගිය යම් නිලධරයකු හෝ සේවකයෙකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඇ) සමිතිය හෝ එහි කාරක සභාව හා සමිතියේ අතීත හෝ වර්තමාන යම් නිලධරයෙකු හෝ සේවකයකු යම් මියගිය නිලධරයෙකුගේ හෝ සේවකයකුගේ යම් උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු අතර ; හෝ

(ඈ) සමිතියේ හෝ එහි කාරක සභාව ; සහ
   (i) ව්‍යාපාරික හෝ ඉන් කොටසක් ඒ සමිතියට පවරනු ලැබූ වෙනයම් සමිතියක සාමාජිකයකුව හෝ නිලධරයකුව හෝ සේවකයකුව සිටි යම් තැනැත්තෙකු ;
   (ii) 1 අනු ඡේදයෙහි සඳහන් සමිතියේ සාමාජිකයෙකු හෝ හිටපු සාමාජිකයෙකු හෝ මියගිය සාමාජිකයෙකු මගින් හිමිකම් කියාපාන යම් තැනැත්තෙකු ;
   (iii) 1 අනු ඡේදයෙහි සඳහන් සමිතියේ යම් නිලධරයෙකු ගේ හෝ සේවකයකුගේ උරුමකරුවෙකු හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකු වන යම් තැනැත්තෙකු අතර ; හෝ

(ඉ) සමිතිය හා ලියාපදිංචි කළ අන්කිසි සමිතියක් අතර, උද්ගත වන්නේ නම්, තීරණය සඳහා ඒ ආරවුල රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබිය යුතු ය.

අතීත හෝ වර්තමාන සාමාජිකයෙකුගෙන්, නිලධරයෙකුගෙන් හෝ සේවකයෙකුගෙන් හෝ මියගිය සාමාජිකයෙකුගේ, නිලධරයෙකුගේ හෝ සේවකයෙකුගේ යම් නම් කළ තැනැත්තෙකුගේ උරුමකරුවෙකු ගෙන් හෝ නීත්‍යානුකූල නියෝජිතයෙකුගෙන් ලියාපදිංචි කළ සමිතියකට අයවිය යුතු යම් ණයක්, ඉල්ලීමක් හෝ අලාභයක් සඳහා ඒ සමිතිය විසින් ඉදිරිපත් කරනු ලැබූ හිමිකම් කියාපෑමක්, ඒ ණය ඉල්ලීම හෝ අලාභය පිළිගත යුතු වුවද නොවුව ද මේ උපවගන්තියේ අර්ථානුකූලව සමිතියේ ව්‍යාපාරයට අදාළ ආරවුලක් ලෙස සලකනු ලැබිය යුතුය.

(2) රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උප වගන්තිය යටතේ යොමු කිරීමක් ලැබීමෙන් පසු -

(අ) තමා විසින් ම ඒ ආරවුල සම්බන්ධයෙන් තීරණය කළ හැකිය ; නැතහොත්

(ආ) ඒ පිළිබඳව සුදුස්සක් කිරීම සඳහා බේරුම්කරුවෙකු හෝ බේරුම්කරුවන් වෙත යොමු කළ හැකිය.

(3) බේරුම්කරුගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුවෙන් අතෘප්තියට පත් යම් පාර්ශවකරුවන් විසින්, විනිවලින් නියම කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් ඇතුළත හා එසේ නියම කරනු ලැබිය හැකි ආකාරයකින් රෙජිස්ට්‍රාර් වෙත ආයාචනය කළ හැකි ය.

(4) (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යම් ආයාචනයක් ඉදිරිපත් කරනු ලැබූ කිසියම් පාර්ශවකරුවෙකුට, ඒ පාර්ශවකරු විසින් ම හෝ යම් නියෝජිතයකු මාර්ගයෙන් රෙජිස්ට්‍රාර් ඉදිරියෙහි පෙනී සිට ඒ ආයාචනය සම්බන්ධයෙන් කරුණු කියා සිටීමට හිමිකම් තොතිබිය යුතු ය.

(5) (2) වැනි උප වගන්තිය යටතේ හෝ (3) වැනි උප වගන්තිය යටතේ වූ ආයාචනයක දී රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව යම් සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(6) (2) වැනි උප වගන්තිය යටතේ බේරුම්කරුවෙකු ගේ හෝ බේරුම්කරුවන්ගේ තීන්දුව සම්බන්ධයෙන් (3) වැනි උප වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත කිසිම ආයාචනයක් යොමු කරනු නොලබන්නේ නම් හෝ එබඳු යම් ආයාචනයක් අත් හරිනු ලබන්නේ නම් හෝ ඉල්ලා අස්කර ගනු ලබන්නේ නම් ඒ තීන්දුව අවසානාත්මක විය යුතු අතර ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(7) මේ වගන්තිය යටතේ ආරවුලක විෂය වන යම් හිමිකම් කියාපෑමක් සම්බන්ධයෙන් කාලසීමා ආඥාපනතේ විධිවිධාන අදාල නොවිය යුතු ය.

(8) මේ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබූ ආරවුලක් ලියාපදිංචි කළ සමිතියක ව්‍යාපාරයට අදාල ආරවුලක් ද යන්න පිළිබඳව යම් ප්‍රශ්නයක් උද්ගත වුවහොත් ඒ සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, ඒ පිළිබඳව කිසිම සිවිල් අධිකරණයක දී ප්‍රශ්න නොකළ යුතු ය.

(9) මේ වගන්තියෙහි "සාමාජිකයා" යන්නට ආශ්‍රිත සාමාජිකයෙක් ද ඇතුළත් වේ.

තීරණයක් හෝ තීන්දුවක් ක්‍රියාත්මක කිරීම.

59. (1) 58 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යොමු කරනු ලැබූ ආරවුලක් හෝ ආයාචනයක් සම්බන්ධයෙන් ඔහුගේ තීරණයකින් (මේ වගන්තියෙහි මින් මතු එය " තීරණයක් " යනුවෙන් හඳුන්වනු ලැබේ.) හෝ ඒ වගන්තිය යටතේ බේරුම්කරුවෙකු වෙත යොමු කරනු ලැබූ ආරවුලක් පිළිබඳ වූත් ඒ වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් වෙත යථා පරිදි ආයාචනයක් ඉදිරිපත් කරනු නොලැබූත්, මේ වගන්තියේ මින් මතු "තීන්දුවක්" යනුවෙන් හඳුන්වනු ලබන තීන්දුවකින් කෙරෙන නිගමනය ඒ ආරවුලේ එක් පාර්ශවකරුවෙකුගෙන් ඒ ආරවුල් අනෙක් පාර්ශවකරුට මුදලක් අයවිය යුතු බව වූත් ඒ මුදල ඊට සම්බන්ධ ගාස්තු හා පොලී ඇතොත් ඒවා සමග නොගෙවා ඇත්තා වූත් අවස්ථාවක රෙජිස්ට්‍රාර් විසින්, ඒ මුදල අය විය යුත්තේ යම් පාර්ශවකරුවෙකුගෙන් ද මේ වගන්තියෙහි මින් මතු "පැහැර හරින්නා" යනුවෙන් හඳුන්වනු ලබන ඒ පාර්ශවකරු සම්බන්ධයෙන් -

(අ) ගාස්තු හා පොලිය සමග ඒ මුදල පිළිබඳ විස්තර හා ඒ පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් දිසාපතිවරයෙකු, සහකාර දිසාපතිවරයෙකු, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත නිකුත් කිරීම ; හෝ

(ආ) ගාස්තුව හා පොලිය ආතොත් ඒ පොලිය ද සමග ඒ මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම අඩංගු සහතිකයක් ඒ පැහැර හරින්නා පදිංචිව සිටින හෝ ඒ පැහැරහරින්නාට අයත් යම් චංචල හෝ නිශ්චල දේපලක් පිහිටි යම් දිස්ත්‍රික්කයක අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් වෙත නිකුත් කිරීම ; හෝ

(ඇ) ගාස්තුව හා පොලිය ඇතොත් ඒ පොලිය ද සමග අයවිය යුතු මුදල පිළිබඳ විස්තර හා පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැනගත් ඔහුගේ ව්‍යාපාරික හෝ පදිංචි ස්ථානය අඩංගු සහතිකයක් ඒ ස්ථානයේ පිහිටි කොට්ඨාශයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු වෙත නිකුත් කිරීම කළ හැකිය.

(2) (අ) රෙජිස්ට්‍රාර් විසින් (1) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ දිසාපතිවරයෙකු, සහකාර දිසාපතිවරයෙකු, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් වෙත සහතිකයක් නිකුත් කරනු ලබන අවස්ථාවකට පැහැර හරින්නාගේ චංචල දේපල තහනමට ගෙන විකුණා ගාස්තු හා පොලී සමග ඒ මුදල අයකර ගැනීමට සැලැස්වීමට ඒ නිලධරයාට මෙයින් බලය පවරා නියම කරනු ලැබේ.

(ආ) ඒ නිලධාරියා විසින් ඒ වෙනුවෙන් ඉතාමත්ම අවස්ථානුකූල යයි සලකනු ලබන යම් ආකාරයකින් එකී තහනමට ගැනීම ක්‍රියාත්මක කළ යුතු අතර එසේ තහනමට ගත් සෑම දේපළක්ම පැහැර හරින්නා විසින් ගාස්තු හා වියදම් ගෙවීමට යටත්ව දින පහක් තබා ගත යුතු ය. පැහැර හරින්නා විසින් ගාස්තු හා පොලිය සහිතව අය විය යුතු ඒ මුදල ද ඒ දේපළ තහනමට ගෙන තබා ගැනීමේ වියදම් හා වැය බර ද එකී දින පහ ඇතුළත නොගෙවන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, දිසාපති, සහකාර දිසාපති, පිස්කල් හෝ නියෝජ්‍ය පිස්කල් විසින් එකී දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබීමට සැලැස්විය යුතුය.

(ඇ) ඒ විකිණීමෙන් ලැබෙන්නා වූ මුදල —

(i) පළමුකොට, ඒ දේපල තහනමට ගැනීම, තබාගැනීම හා විකිණීම පිළිබඳ වූ වියදම් හා ගාස්තු ගෙවීමට ද,

(ii) දෙවනුව, ගාස්තු හා පොලිය සමග අයවිය යුතු මුදල පියවීමට ද යෙදිය යුතු අතර යම් ශේෂයක් ඇතොත් තහනමට ගත් දේපළ අයිතිකරු වෙත එය ගෙවිය යුතුය.

(3) (1) වැනි උප වගන්තියේ (ආ) ඡේදය යටතේ දිසා අධිකරණයක් වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක එය ලැබීමෙන් පසු ඒ අධිකරණය විසින් ඒ පැහැර හරින්නාගේ සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යම් අවස්ථාවක ඒ ලැබීමෙන් පසු ... සියලුම චංචල හෝ නිශ්චල දේපළ හෝ ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණා හෝ ඒ මුදල අයකර ගැනීම සඳහා පිස්කල් විසින් අවශ්‍ය යයි සැලකිය හැකි ඉන් යම් කොටසක් තහනමට ගෙන විකුණන ලෙස විධාන කළ ලෙස පිස්කල්ට බලය පවරන හා නියම කෙරෙන දේපළ තහනම් ඇස්තිපියක් පිස්කල් වෙත නිකුත් කරන ලෙස විධාන කළ යුතු ය. ඒ තහනමට ගෙන විකිණීම සම්බන්ධයෙන් සිවිල් නඩු විධාන සංග්‍රහයේ 226 හා 297 වැනි වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතුය.

(4) (1) වැනි උප වගන්තියේ (ඇ) ඡේදය යටතේ මහේස්ත්‍රාත්වරයෙකු වෙත සහතිකයක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, මුදල් අය කර ගැනීම සඳහා පැහැර හරින්නාට විරුද්ධව වැඩි දුරටත් ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දැක්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් ඒ පැහැර හරින්නා තමා ඉදිරියට කැඳවිය යුතු අතර, ප්‍රමාණවත් හේතු ඔහු විසින් නොදක්වන ලද්දේ නම් බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි වුවද දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදකට ඒ පැහැර හරින්නාත් සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයා විසින් කරන ලද දණ්ඩන නියමයකින් නියම කෙරුණු දඩයක් ලෙස ඒ මුදල සලකනු ලැබිය යුතු ය. එවිට 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වැනි වගන්තියේ (එහි (1) වැනි උපවගන්තියේ (අ) හා (ඇ) ඡේද හැර) විධිවිධාන අදාළ විය යුතු අතර ඒ දණ්ඩන නියමය කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ විධානයක්, ඔහු විසින් කළ හැකිය.

(5) රෙජිස්ට්‍රාර් මේ වගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරන අවස්ථාවක ඒ පිළිබඳ නිවේදනයක් පෞද්ගලිකව භාර දීමෙන් ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ විද්‍යුත්පණිවුඩ මාර්ගයෙන් යැවීමෙන් පැහැර හරින්නා වෙත නිකුත් කළ යුතු ය. එසේ වුවත් පැහැර හරින්නා ඒ නිවේදනය නොලැබීම හේතු කොට ගෙන මේ වගන්තිය යටතේ වූ නීති කෘත්‍ය අවලංගු නොවිය යුතුය.

(6) මේ වගන්තිය යටතේ වූ යම් නීති කෘත්‍යවලදී රෙජිස්ට්‍රාර්ගේ සහතිකයෙහි වූ යම් ප්‍රකාශයක නිවැරදි භාවය සොයා බැලීමට පරීක්ෂා කිරීමට හෝ ඒ පිළිබඳව තීරණය කිරීමට යම් දිසා අධිකරණයකට හෝ මහේස්ත්‍රාත්වරයෙකුට මේ වගන්තියේ කිසිවකින් බලය නොලැබිය යුතුය. නොහොත් නියම නොවිය යුතුය.

(7) (3) වැනි උප වගන්තිය යටතේ විකිණීමෙන් ලත් යම් මුදලක් හා (4) වැනි උප වගන්තිය යටතේ ගෙවන ලද හෝ අය කරන ලද යම් මුදලක් අවස්ථෝචිත පරිදි දිසා අධිකරණයේ හෝ මහේස්ත්‍රාත්වරයා විසින් රෙජිස්ට්‍රාර්වරයා වෙත යැවිය යුතුය. රෙජිස්ට්‍රාර් විසින් ඒ මුදල සම්බන්ධයෙන් අදාළ තීරණය හෝ තීන්දුව අනුව ප්‍රදානයක් කළ යුතු ය.

වෙනත් ඇතැම් කරුණු සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු බව.

60. (1) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකත්වය සඳහා යම් තැනැත්තෙකු විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලුම්පත්‍රයක් ඒ සමිතිය විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක ඒ ප්‍රතික්ෂේප කිරීමට විරුද්ධව ඒ තැනැත්තා විසින් රෙජිස්ට්‍රාර් වෙත අභියාචනය කළ හැකිය. ඒ අභියාචනය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්ගේ තීරණය අවසානාත්මක විය යුතු අතර, එය පිළිපැදීමට සමිතිය බැඳී සිටිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයෙකු ඒ සමිතියේ ධුරයකට යථා පරිදි තෝරා පත්කර ගන්නා ලද්දේ ද යන්න සම්බන්ධයෙන් හෝ සාමාජිකයෙකු ඒ සමිතියේ සාමාජිකයෙකුව හෝ නිලධරයකුව සිටීම නතර වූයේ ද යන්න සම්බන්ධයෙන් හෝ සමිතියේ යම් මහ සභා රැස්වීමක් වලංගු ලෙස පවත්වනු ලැබුවේ ද යන්න සම්බන්ධයෙන් යම් ප්‍රශ්නයක් උද්ගත වන අවස්ථාවක ඒ ප්‍රශ්නය සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර් විසින් තීරණය කළ යුතු අතර ඔහුගේ තීරණය අවසානාත්මක විය යුතු ය.

## XI වැනි පරිච්ඡේදය

### රීති

61. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ හෝ බල ගැන්වීමේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි සියළු රීති වයඹ පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් සෑදිය හැකිය.

(2) විශේෂයෙන්ම හා (1) වැනි උප වගන්තියෙන් පැවරුණු බලතලවල සාමාන්‍යත්වයට හානියක් නොමැතිව ඒ රීතිවලින් —

(අ) සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමේ දී අනුගමනය කළ යුතු කොන්දේසි හා ඒ ඉල්ලුම් කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය නියම කළ හැකිය ;

(ආ) සාමාජිකයන් වශයෙන් ඇතුළත් වීම සඳහා ඉල්ලුම් කරන හෝ සාමාජිකයන් වශයෙන් ඇතුළත් කරගනු ලැබූ තැනැත්තන් විසින් අනුගමනය කළ යුතු කොන්දේසි නියම කළ හැකි අතර කලින් කල සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හා ඇතුළුකර ගැනීම හා සාමාජිකත්වයේ අයිතිවාසිකම් පාවිච්චි කිරීමට පෙර කළ යුතු ගෙවීම හා ලබාගත යුතු සම්බන්ධතා සඳහා විධි විධාන සැලැස්විය හැකිය ;

(ඇ) සාමාජිකයන් ඉල්ලා අස්වීම හා නෙරපීම සඳහා ද ඉල්ලා අස්වන හෝ නෙරපනු ලබන සාමාජිකයන්ට කළ යුතු ගෙවීම් සඳහා ද මියගිය සාමාජිකයන්ගේ වගකීම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ඈ) ලියාපදිංචි කළ සමිතියක සාමාජික සංඛ්‍යාව ඒ සමිතිය විසින් සීමා කළ හැකි ප්‍රමාණය නියම කළ හැකිය;

(ඉ) මියගිය සාමාජිකයකුගේ සම්බන්ධතාවයේ වටිනාකම නිශ්චය කළ යුතු ආකාරය සඳහා ද ඒ සම්බන්ධතාවයේ වටිනාකම ගෙවිය හැකි හෝ පැවරිය හැකි තැනැත්තකු නම් කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය.

(ඊ) 3 වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව, සාමාජිකයෙකු සතුව තිබිය හැකි ලියාපදිංචි කළ සමිතියක ප්‍රාග්ධනයේ වැඩිම කොටස් ගණන හෝ පංගුව නියම කළ හැකිය ;

(උ) ණය හෝ මුදල් ණයවර සඳහා ඉල්ලුම් කරන සාමාජිකයන් විසින් කළයුතු ගෙවීම්, අනුගමනය කළ යුතු කොන්දේසි හා ලියා අත්සන් කළයුතු බැඳුම්කරවල, නීත්‍යානුකූල ලේඛනවල හෝ වෙනත් ලේඛනවල ආකෘති දිය හැකි ණයවල හෝ ප්‍රදානය කළ හැකි ණයවරවල කාල සීමාව, යම් සාමාජිකයන්ට පනවනු ලැබිය හැකි උපරිම මුදල හා ඔවුන් සම්බන්ධයෙන් ඉඩ දෙනු ලැබිය හැකි වැඩිම ණයවර නියම කළ හැකිය ;

(ඛ) සීමාරහිත වගකීම්වලින් යුත් සමිතියක සාමාජිකයින්ට ලාභ බෙදා දිය හැක්කේ යම් කොන්දේසිවලට යටත්ව ද ඒ කොන්දේසි හා සමිති විසින් ගෙවිය හැකි ලාභාංශ පිළිබඳව උපරිම ප්‍රමාණය නියම කළ හැකිය ;

(ග) කොටස් මගින් හෝ සාමාජික පත්‍ර මගින් හෝ වෙනත් යම් ආකාරයකින් අරමුදල් ලබාගත හැකි ආකාරය හා තැන්පතු සම්බන්ධයෙන් ගෙවිය හැකි පොලී ප්‍රමාණය විධිමත් කළ හැකිය ;

(ඝ) සාමාජිකයන්ගේ මහා සභා රැස්වීම් සඳහා ද ඒ රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහා ද රැස්වීම්වල දී පාවිච්චි කළ යුතු බලතල සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ඞ) ලියාපදිංචි කළ සමිතියක සාමාජිකයකු, කළමනාකරන කාරක සභාවේ හෝ ප්‍රාදේශීය හෝ ශාඛා කාරක සභාවක සාමාජිකයකු ලෙස තෝරා පත්කර ගැනීම සම්බන්ධයෙන් වූ සුදුසුකම් නියම කිරීම ;

(ච) කාරක සභාවල සාමාජිකයන් හා වෙනත් නිලධරයන් පත් කිරීම ඔවුන්ගේ සේවය අත්හිටුවීම හා ඔවුන් ඉවත් කිරීම සඳහා ද කාරක සභා රැස්වීම්වල කාර්ය පටිපාටිය සඳහා ද කාරක සභාව හා වෙනත් නිලධරයන් විසින් පාවිච්චි කළ යුතු බලතල හා ඉටු කළ යුතු යුතුකම් සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ඡ) සමිතියක් විසින් අතුරු ව්‍යවස්ථා සෑදිය හැකි හෝ සෑදිය යුතු කරුණු සහ අතුරු ව්‍යවස්ථා සෑදීමේ දී, වෙනස් කිරීමේ දී හා පරිච්ඡින්න කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ඒ අතුරු ව්‍යවස්ථා සෑදීමට වෙනස් කිරීමට හෝ පරිච්ඡින්න කිරීමට පෙර සපුරාලිය යුතු කොන්දේසි නියම කළ හැකිය ;

(ජ) ලියාපදිංචි කළ හැකි සමිතියක් විසින් තැබිය යුතු ගිණුම් හා පොත් සහ ලියාපදිංචි කළ සමිතියක වත්කම් හා වගකීම් පෙන්නුම් කරන ශේෂ පත්‍රයක් කලින් කල පළ කිරීමට නියම කළ හැකිය ;

(ඣ) ලියාපදිංචි කළ සමිතිවල ගණන් විගණනය කිරීම සඳහා සහ ඒ විගණනය සඳහා ගෙවිය යුතු යම් ගාස්තු ඇතොත් ඒ ගාස්තු ගෙවීම සඳහා විධිවිධාන සැලැස්වීම ද පවත්නා සමිති විගණනය කිරීම ඒවා පරිපාලනය කිරීම සහ ඒවාට සහාය දීම සඳහාද සමූපකාර ප්‍රචාරක කටයුතු සඳහාද සමූපකාර අධ්‍යාපනය හා පුහුණුව සඳහා ද පාවිච්චි කිරීම පිණිස සමූපකාර අරමුදල නමින් හැඳින්වෙනු ලබන අරමුදලකට සියළුම ලියාපදිංචි කළ සමිතිවලින් හෝ එවැනි යම් සමිතිවලින් දායක මුදල් අය කිරීමට විධිවිධාන සැලැස්වීම ද ඒ අරමුදලේ පරිපාලනය සඳහා විධි විධාන සැලැස්වීම ද කළ හැකිය.

(ඤ) ලියාපදිංචි කරන ලද සමිති විසින් රෙජිස්ට්‍රාර් වෙත ඉදිරිපත් කළ යුතු වාර වාර්තා සහ ඒ වාර වාර්තා ඉදිරිපත් කළ යුතු නැනැත්තන් හා ආකාරය නියම කළ හැකිය ;

(ට) ලියාපදිංචි කළ සමිති සතු පොත්වල ඇතුළත්ව ඇති සටහන් වල පිටපත් සහතික කළ හැකි තැනැත්තන් හා ආකාරය සඳහා විධිවිධාන සැලැස්විය හැකිය ;

(ඩ) සාමාජිකයන්ගේ නාම ලේඛනයක් සහ සාමාජිකයන්ගේ වගකීම් කොටස්වලින් සීමාසහිත වූ අවස්ථාවක කොටස් පිළිබඳ නාම ලේඛනයක් සකස් කොට පවත්වාගෙන යාම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ණ) සංචිත අරමුදල් ඇතිකොට පවත්වාගෙන යාම හා ඒ අරමුදල් යෙදිය හැකි පරමාර්ථ සඳහා ද ලියාපදිංචි කළ සමිතියක පාලනය යටතේ ඇති යම් අරමුදල් ආයෝජනය කිරීම සඳහා ද විධිවිධාන සැලැස්විය හැකිය ;

(ත) සමිතියක් වෙත හෝ ඒ මාර්ගයෙන් ද්‍රව්‍ය විකිණීමට අදාල යම් අතුරු ව්‍යවස්ථාවක් හෝ ගිවිසුමක් කඩ කිරීමක් පිළිබඳ යම් ප්‍රශ්නයක් නිශ්චය කළ හැකි ආකාරය හා එබඳු යම් කඩ කිරීමක් නිසා වූ ප්‍රමාණ කළ අලාභය නිශ්චය කළ හැකි හෝ තක්සේරු කළ හැකි ආකාරය නියම කළ හැකිය ;

(ද) බේරුම්කරුවකු හෝ බේරුම්කරුවන් පත් කිරීමේ ක්‍රමය හා රෙජිස්ට්‍රාර් හෝ ඒ බේරුම්කරු හෝ බේරුම්කරුවන් ඉදිරියෙහි පැවැත්වෙන නඩුවලදී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා රෙජිස්ට්‍රාර්ගේ තීරණය හෝ බේරුම්කරුවන්ගේ තීන්දු ක්‍රියාත්මක කළ යුතු ආකාරය නියම කළ හැකිය. රෙජිස්ට්‍රාර් විසින් කරන ලද නියෝගවලට විරුද්ධව මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමූපකාර විෂය භාර අමාත්‍යවරයා වෙත අයාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වූ ද මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තාවූ ද කරුණු නිශ්චය කළ හැකිය ;

(න) ආණ්ඩුවෙන් හෝ පළාත් සභාවෙන් මුදල් ආධාර සඳහා ඉල්ලුම් කරන ලියාපදිංචි කළ සමිතියක් විසින් පිළිපැදිය යුතු කොන්දේසි නියම කළ හැකිය ;

(ප) රෙජිස්ට්‍රාර් විසින් කරන ලද නියෝගවලට විරුද්ධව අමාත්‍යවරයා වෙත ආයාචනයක් ඉදිරිපත් කළ හැකි විය යුතු වූ ද, මේ ප්‍රඥප්තිය යටතේ ප්‍රකාශිතවම විධිවිධාන සලස්වා නැත්තා වූ ද කරුණු නිශ්චය කළ හැකිය ;

(බ) 52 වැනි වගන්තිය යටතේ පත් කරනු ලැබූ ඈවරකරුවෙකු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය හා ඒ බේරුම්කරුගේ නියෝගවලට විරුද්ධව ආයාචනා ඉදිරිපත් කළ හැකි විය යුතු අවස්ථා නියම කළ හැකිය.

(ම) 57 වැනි වගන්තියෙහි සඳහන් අතිරික්ත අරමුදලක් පිහිටුවා පවත්වාගෙන යාම සඳහා විධිවිධාන සැලැස්වීම හා ඒ අරමුදලේ මුදල් වියදම් කළ හැකි ආකාරය හා කාර්යයන් නියම කිරීම කළ හැකිය ;

(ය) මේ ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ රීති යටතේ අයාචනා ඉදිරිපත් කිරීම, ඇසීම, හා ඒ පිළිබඳ සුදුස්සක් කිරීම සම්බන්ධයෙන්, පාවිච්චි කළ යුතු ආකෘති, ගෙවිය යුතු ගාස්තු, පිළිපැදිය යුතු කාර්ය පටිපාටිය හා ඒවාට සම්බන්ධ හෝ අනුෂාංගික වෙනත් සියලු කරුණු නියම කිරීම කළ හැකිය ;

(3) මධ්‍යම පළාතේ පළාත් සභාව විසින් අනුමත කරනු ලැබුවේ නම් මිසක කිසිම රීතියක් බල නොපැවැත්විය යුතුය. ඒ අනුමතිය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

(4) (3)වැනි උප වගන්තියෙන් නියමිත නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු සෑම රීතියක්ම මෙහි පනවනු ලැබුවාක් මෙන් වලංගු හා බල සහිත විය යුතුය.

## XII වැනි පරිච්ඡේදය

### *ආණ්ඩුවට අයවිය යුතු ණය*

*ආණ්ඩුවට සහ පළාත් සභාවට අයවිය යුතු මුදල් අයකර ගැනීම.*

62. (1) ලියාපදිංචි කළ සමිතියකින් හෝ ලියාපදිංචි කළ සමිතියක යම් නිලධරයෙකුගෙන් හෝ සාමාජිකයෙකුගෙන් හෝ එහි හිටපු සාමාජිකයෙකුගෙන් එම තත්ත්වයෙන් ආණ්ඩුවේ ණය, පළාත් සභාවේ ණය හා ආණ්ඩුව ඇපවූ ණය හා පළාත් සභාව ඇප වූ ණය වෙනුවෙන් අය විය යුතු මුදල් හා 46 වැනි වගන්තිය යටතේ ආණ්ඩුවට ප්‍රදානය කරන ලද යම් ගාස්තු ද ඇතුළත්ව ආණ්ඩුවට අය විය යුතු සියලු මුදල්, ජනරජයට අය විය යුතු ණය අයකර ගැනීම සඳහා ආණ්ඩුවේ ණයකරු ආඥාපනත යටතේ විධිවිධාන සලස්වා ඇති ආකාරයෙන්ම අය කර ගනු ලැබිය හැකි අතර 40 (2) වැනි වගන්තියේ විධිවිධානවලට යටත්ව අන්කිසි තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට අය විය යුතු මුදල්වලට ඉහළින් ඒවාට ප්‍රමුඛත්වය ලැබිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකින් ආණ්ඩුවට හා පළාත් සභාවට අය විය යුතුව (1) වැනි උප වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් පළමුව සමිතියේ දේපළවලින් අයකරගත හැකිය. දෙවනුව සාමාජිකයන්ගේ වගකීම සීමා කරනු ලැබූ ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගේ වගකීමේ සීමාවට යටත්ව සාමාජිකයන්ගෙන්ද තෙවනුව අන් සමිති සම්බන්ධයෙන් වූ විට සාමාජිකයන්ගෙන් ද අයකර ගත හැකිය.

## XIII වැනි පරිච්ඡේදය

### *විවිධ කරුණු*

*ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් වූ නියමයන්ගෙන් යම් සමිතියක් නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලය.*

63. මේ ප්‍රඥප්තියෙහි කුමක් සඳහන්ව ඇත ද එය නොතකා මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ ආඥාවකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව, ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් මේ ප්‍රඥප්තියේ වූ නියමයන්ගෙන් යම් නියමයකින් යම් සමිතියක් නිදහස් කළ හැකිය.

*මේ පනතේ විධිවිධානවලින් .. ා නිදහස් කිරීමට අමාත්‍යවරයා සතු විශේෂ බලයයි.*

64. මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයා විසින් සාමාන්‍ය හෝ විශේෂ ආඥාවක් මාර්ගයෙන් මේ ප්‍රඥප්තියේ විධිවිධානවල යම් විධිවිධානයකින් ලියාපදිංචි කළ යම් සමිතියක් හෝ සමිති පංතියක් නිදහස් කිරීම, හෝ ආඥාවෙහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් දිනක සිට හෝ යම් වෙනස්කිරීම් සහිතව ඒ විධිවිධාන යම් සමිතියකට හෝ සමිති පංතියකට අදාල විය යුතු යයි විධාන කිරීම කළ හැකිය.

*"සමුපකාර" යන වචනයේ පාවිච්චිය සීමා කිරීම.*

65. (1) "එක්සත් සහකාර" යන වචන හෝ "සමුපකාර" යන වචනය හෝ දෙමළ භාෂාවෙන් "අයික්කිය" ( ) යන වචනය හෝ "කූට්ටුරවු" ( ) යන වචනය හෝ ඉංග්‍රීසි භාෂාවෙන් "කෝපරේටිව්" (Co-operative) යන වචනය කොටසක් වන යම් නාමයක් හෝ අභිධානයක් යටතේ වෙළඳාම් කිරීම හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යාම ලියාපදිංචි කළ සමිතියක් නොවන කිසිම තැනැත්තකු විසින් මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය නොමැතිව නොකළ යුතුය.

එසේ වුවද 1921 සැප්තැම්බර් මස විසි දෙ වැනි දිනට පෙර යම් තැනැත්තකු විසින් වෙළඳාමක් කරගෙන යන ලද්දේ හෝ ව්‍යාපාරයක් පවත්වාගෙන යන ලද්දේ යම් නාමයක් හෝ අභිධානයක් යටතේ ද ඒ තැනැත්තා විසින් හෝ ඔහුගේ සම්බන්ධතාවයෙහි අනුප්‍රාප්තිකයා විසින් ඒ නාමය හෝ අභිධානය පාවිච්චි කිරීම සම්බන්ධයෙන් මේ වගන්තියේ කිසිවක් අදාළ නොවිය යුතුය.

(2) මේ වගන්තියේ විධිවිධාන කඩ කරන කවර තැනැත්තකු වුවද මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියය දක්වා විය හැකි දඩයකට හා වරද අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන අවස්ථාවක් වූ විට ඒ වරදට වරදකරු කරනු ලැබීමෙන් පසු කවදුරටත් ඒ වරද කරගෙන යනු ලබ ා එක් එක් දිනය සඳහා රුපියල් පනහක අතිරේක දඩයකට ද යටත් විය යුතුය.

*සමිතියකට ලැබිය යුතු මුදල් ආපසු ගෙවීමට හෝ අන් දේපළක් ආපසු භාරදීමට රෙජිස්ට්‍රාර් විසින් නියම කළ හැකි බව.*

66 (1) ලියාපදිංචි කළ සමිතියක් සම්බන්ධයෙන් 44 වැනි වගන්තිය යටතේ විගණනයක දී හෝ 47 වැනි වගන්තිය යටතේ විභාගයක දී හෝ 47 වැනි වගන්තිය යටතේ සමිතියේ පොත් පරීක්ෂා කර බැලීමේ දී හෝ 46 වැනි වගන්තිය බැලීමේ දී හෝ ගණන් බේරා වසා දැමීමේ දී ඒ සමිතිය සංවිධානය කිරීමෙහි ලා හෝ එහි කළමණාකාරිත්වයෙහි ලා සහභාගි වූ මේ ප්‍රඥප්තියෙහි හෝ වෙනත් පනතක විධි විධානවලට හෝ ඒ යටතේ සාදන රීතිවලට හෝ නියෝගවලට නැතහොත් සමිතියේ අතුරු ව්‍යවස්ථාවලට හෝ කාරක රීතිවලට හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් අනුමත කරන ලද මුදල් කාර්ය පරිපාටියට හෝ රෙජිස්ට්‍රාර්වරයා හෝ සමුපකාර සේවක කොමිෂන් සභාව හෝ විසින් නිකුත් කරන ලද යම් පොදු විධිවිධානවලට පටහැනිව සමිතියේ අරමුදල් ප්‍රයෝජනයට ගත් යම් තැනැත්තෙකුගෙන් හෝ තැනැත්තන් කණ්ඩායමකින් හෝ ඒ සමිතියේ හිටපු හෝ දැනට සිටින යම් නිලධරයකුගෙන් හෝ සේවකයෙකුගෙන් ඒ සමිතියට යම් මුදලක් හෝ අන් දේපලක් ලැබිය යුතු බව පෙනෙන

අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි රෙජිස්ට්‍රාර් විසින්, තමාගේ ඕනෑකම පිට හෝ සමිතියේ කාරක සභාවේ හෝ ඇවරයෙකුගේ හෝ යම් ණය හිමියෙකුගේ හෝ දායකයකුගේ ඉල්ලීම පිට ඒ තැනැත්තාගේ හෝ තැනැත්තන් කණ්ඩායමේ හෝ නිලධරයන්ගේ හෝ සේවකයින්ගේ ක්‍රියා කලාපය සම්බන්ධයෙන් පරීක්ෂා කර —

(අ) ඒ මුදල හෝ එහි කොටසක් රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යයි අදහස් කරනු ලබන පොලියක් සමග ආපසු ගෙවන ලෙස ;

(ආ) ඒ අන් දේපළ හෝ එහි කොටසක් ආපසු භාර දෙන ලෙස ; හෝ

(ඇ) සමිතියේ වත්කම්වලට රෙජිස්ට්‍රාර් විසින් සුදුසු යැයි අදහස් කරනු ලබන යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවන ලෙස

ඔහුට හෝ ඒ කණ්ඩායමට නියම කරමින් නියෝගයක් කළ හැකිය. එවැනි යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට විරුද්ධව එවැනි යම් නියෝගයක් කිරීමට පෙර රෙජිස්ට්‍රාර් විසින්, ඒ නියෝගය නොකළ යුත්තේ මන්දැයි කරුණු කියා සිටීමට හා හේතු දැක්වීමට ඒ තැනැත්තාට හෝ තැනැත්තන් කණ්ඩායමට අවස්ථාවක් දිය යුතුය.

(2) ලියාපදිංචි කළ සමිතියකට යම් මුදලක් ආපසු ගෙවීම සඳහා හෝ එහි වත්කම්වලට යම් දායක මුදලක් වන්දි වශයෙන් ගෙවීම සඳහා (1) වැනි උප වගන්තිය යටතේ කරන ලද නියෝගයක් අනුව ක්‍රියාකර නොමැති අවස්ථාවක සමිතියේ ලියාපදිංචි කළ ව්‍යාපාර ස්ථානය පිහිටි හෝ ඒ නියෝගය කරන ලද්දේ යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ යම් නිලධරයකුට හෝ සේවකයකුට විරුද්ධව ද ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා පදිංචිව සිටින හෝ ව්‍යාපාරය කරගෙන යන ස්ථානය පිහිටි කොට්ඨාශය තුළ අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත් වෙත ඉල්ලුම් කොට ඒ මුදල බන්ධනාගාර ගත කිරීමෙන් දඬුවම් කළ නොහැකි දඩයකින් පමණක් දඬුවම් කළ හැකි වරදක් සඳහා ඒ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම හෝ නිලධරයා හෝ සේවකයා සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයාගේ දණ්ඩන නියමයකින් නියම කරන ලද දඩයක් වූවාක් මෙන් අයකර ගනු ලැබිය හැකි අතර, 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහයේ 291 වැනි වගන්තියෙහි (එම වගන්තියේ (1) වැනි උප වගන්තියේ (අ) සහ (ඇ) ඡේද හැර විධිවිධාන ඉතික්බිතිව අදාල විය යුතුය. තව ද ඒ දණ්ඩනය නියම කරන අවස්ථාවේ දී ඒ වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකිව තිබූ යම් විධානයන් ද ඔහු විසින් කළ හැකිය. රෙජිස්ට්‍රාර් විසින් කරනු ලැබූ යම් නියෝගයක නිරවද්‍යතාවය මේ වගන්තිය යටතේ තිබෙන නීති කෘත්‍යයක දී සලකා බැලීමට, පරීක්ෂා කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට මේ වගන්තියේ කිසිවකින් බලය ලැබීම හෝ නියමවීම සිදු නොවිය යුතුය.

(3) අන් කිසි ලිඛිත නීතියක් යටතේ වූ යම් වරදක් සම්බන්ධයෙන් (1) වැනි උප වගන්තියෙහි සඳහන් යම් තැනැත්තකුට හෝ තැනැත්තන් කණ්ඩායමකට හෝ නිලධරයකුට හෝ සේවකයෙකුට විරුද්ධව නඩුවක් පැවරීම හෝ පවත්වාගෙන යාම මේ වගන්තියේ පෙරාතුව වූ විධිවිධාන හෝ ඒ යටතේ යම් නියෝගයක් කිරීම හේතු කොට ගෙන, වැළැක්වෙන ලෙස හෝ ඒ කෙරෙහි වෙනයම් ආකාරයකින් බලපාන ලෙස සලකනු ලැබීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

සාමාජිකයන් නම් කිරීම.

67. ලියාපදිංචි කළ සමිතියක කටයුතු කාර්යක්ෂම ලෙස කළමනාකරණය කිරීම සහතික කිරීමේ කාර්ය සඳහා හෝ, ලංකා මහ බැංකුව හෝ යම් රාජ්‍ය බැංකුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් හෝ විසින් එම ලියාපදිංචි කළ සමිතිය සම්බන්ධයෙන් කරනු ලබන යම් ආයෝජන හෝ එට මුදලින් හෝ බඩුවලින් දෙනු ලබන අත්තිකාරම් හෝ ආරක්ෂා කිරීමේ කාර්ය සඳහා, අවශ්‍ය යයි හෝ අවස්ථාවෝචිත යයි රෙජිස්ට්‍රාර්වරයා විසින් අදහස් කරනු ලබන අවස්ථාවක මේ ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් නීතියක හෝ ඒ ලියාපදිංචි කළ සමිතියේ අතුරු ව්‍යවස්ථාවල එට පටහැනිව කුමක් සඳහන් වුව ද ඒ කාර්ය සඳහා අවශ්‍යයයි හෝ අවස්ථාවෝචිත යයි ඔහු අදහස් කරන තැනැත්තන් සංඛ්‍යාවක් ඒ ලියාපදිංචි කළ සමිතියේ කාරක සභාවේ සාමාජිකයන් හැටියට ඔහු විසින් නම් කළ හැකි ය.

එසේ වුව ද ඒ නම් කළ සාමාජිකයන්ගේ සංඛ්‍යාව ඒ කාරක සභාවේ සාමාජිකයන්ගේ මුළු සංඛ්‍යාවෙන් අර්ධයකට අඩු විය යුතු ය.

විශ්වාසය කඩ කිරීම සම්බන්ධයෙන් නිලධරයන් ආදීන්ගේ වගකීම.

68. ලියාපදිංචි කළ සමිතියක ගණන්, 44 වැනි වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි විගණනය කරනු ලැබීමෙන් පසුව හෝ 46 වැනි වගන්තිය යටතේ වූ විභාගයකින් පසුව හෝ, ලියාපදිංචි කළ සමිතියක පොත් පරීක්ෂාකර බැලීම සහ එහි කටයුතු විමර්ශණය කිරීම 47 වැනි වගන්තිය යටතේ කිරීමෙන් පසුව හෝ සමිතියේ නිලධරයකු හෝ සාමාජිකයකු හෝ සේවකයකු වශයෙන් වූ තම තත්වයෙන් යම් මුදලක් යම් බඩු හෝ දේපල භාරව සිටින හෝ යම් අවස්ථාවක භාරව සිටි තැනැත්තා ඒ මුදල්, බඩු හෝ දේපල පිළිබඳ ආධිපත්‍යය ඇතිව සිටින හෝ යම් අවස්ථාවක ඇතිව සිටි හෝ තැනැත්තකු විසින් ඒ නිලධරයා, සාමාජිකයා හෝ සේවකයා වශයෙන් තමා ළඟ තබාගෙන සිටින හෝ තමාගෙන් අය විය යුතු බවට තමා විසින් තබන ලද හෝ අත්සන් කරන ලද ගණන් පොත්වල හෝ ප්‍රකාශවල පෙන්නුම් කෙරෙන යම් මුදලක් හෝ එහි ශේෂයක් ගෙවන ලෙස හෝ ඉදිරිපත් කරන ලෙස හෝ එවැනි යම් බඩුවල හෝ දේපොලවල වටිනාකම ගෙවන ලෙස හෝ රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ තැනැත්තාට නියම කිරීම නීත්‍යානුකූල විය යුතු ය. තවද එසේ නියම කරනු ලැබීමෙන් පසු ඒ තැනැත්තා විසින් ඒ මුදල හෝ එහි ශේෂය හෝ වහාම ගෙවීම හෝ ඉදිරිපත් කිරීම හෝ එම බඩුවල හෝ දේපළවල වටිනාකම ගෙවීම හෝ යථා පරිදි ඒ සඳහා ගණන් ඉදිරිපත් කිරීම පැහැර හැරියහොත් ඔහු සාපරාධී විශ්වාස කඩ කිරීමේ වරදට වරදකරු වන අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු 10ක් නොඉක්මවන කාල සීමාවකට දෙආකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කරනු ලැබීමට යටත් විය යුතුවා මෙන්ම දඩයකට ද ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්ම වුව ද ඔහු යටත් විය යුතුය.

යම් තොරතුරක් හෝ පොතක් ඉදිරිපත් කරන ලෙස රෙජිස්ට්‍රාර් විසින් බැංකුවකට නියම කළහැකි බව.

69. අන්කිසි ලිඛිත නීතියක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා රෙජිස්ට්‍රාර් විසින් අවශ්‍යයයි ඔහු අදහස් කරන අවස්ථාවක –

(අ) යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් බැංකුව සමග කරනු ලබන ගනුදෙනු සම්බන්ධයෙන් යම් තොරතුරක් සපයන ලෙස ;

(ආ) බැංකුව සමග පවතින ඒ සමිතියේ ගිණුම් පෙන්නුම් කරන පිටපතක් බැංකුව විසින් තබා ඇති ලේඛනයෙන් ඉදිරිපත් කරන ලෙස ; හෝ

(ඇ) සමිතියේ බැරට ගෙවන ලද හෝ සමිතිය විසින් පිටයත් කරන ලද යම් වෙක්පත් ඉදිරිපත් කරන ලෙස යම් බැංකුවකට නියම කළ හැකිය.

නඩු පැවරීම මෙහෙයවීම කවුරුන් විසින් කළ යුතුද.

70. ලියාපදිංචි කරන ලද සමිතියකට අදාල යම් කරුණක් සම්බන්ධයෙන් විමර්ශණය පැවැත්වීම. විභාග කිරීම හා 1979 අංක 15 දරන අපරාධ නඩු විධිවිධාන සංග්‍රහය පනතේ XVII වැනි පරිච්ඡේදය යටතට වැටෙන නඩු පැවරීම් මෙහෙයවීම සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධරයකු විසින් කිරීම නීත්‍යානුකූල වන්නේය.

සමාගම් ආඥාපනත හා වෘත්තීය සමිති ආඥාපනත අදාල නොවිය යුතු බව.

71. සමාගම් ආඥාපනතේ හා වෘත්තීය සමිති ආඥාපනතේ විධිවිධාන හා ඒ ආඥාපනත් සංශෝධනය කරන යම් ප්‍රඥප්තිවල විධිවිධාන මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ සමිතිවලට අදාල නොවිය යුතු ය.

දැනට පවත්නා සමිති, රීති යනාදිය පිළිබඳ කතා ගැනීම.

72. (1) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හෝ එම පනත මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචිකරනු ලැබූ ලෙස සැළකෙන සෑම සමිතියක්ම මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ සමිතියේ අතුරු ව්‍යවස්ථා වෙනස් කරනු ලබන හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් මේ ප්‍රඥප්තියේ ප්‍රකාශිත විධි විධාන සමග ගැලපෙන පමණට අඛණ්ඩව බල පැවැත්විය යුතුය.

(2) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හෝ එම පනත මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ සාදනු ලැබූ මේ ප්‍රඥප්තිය ආරම්භ වන අවස්ථාවේ බල පවත්නා සියළු රීති ඒවා මේ ප්‍රඥප්තිය විධිවිධාන සමග ගැලපෙන පමණට මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ රීති වෙනුවට 61 වගන්තිය යටතේ අලුත් රීති සාදනු ලබන තෙක් ඒවා අඛණ්ඩව බල පැවැත් විය යුතු ය.

(3) මෙම ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේ දී මේ දක්වා ක්‍රියාත්මක වූ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත හෝ එම පනත මගින් අවලංගු කරන ලද යම් ප්‍රඥප්තියක් යටතේ කරන ලද හෝ කරනු ලැබූ ලෙස සැළකෙන සියලු පත් කිරීම්, කරනු ලැබූ හෝ කරනු ලැබූ ලෙස සැළකෙන සියලුම නියෝග, නිකුත් කරනු ලැබූ හෝ නිකුත් කරනු ලැබූ ලෙස සැලකෙන සියලුම නිවේදන හා දැන්වීම්, පවරනු ලැබූ හෝ පවරනු ලැබූ ලෙස සැළකෙන සියලුම සිවිල් නඩු හා වෙනත් නීති කෘත්‍ය හා පැන නැග ඇති සියලුම ආරවුල් මේ ප්‍රඥප්තිය යටතේ පිළිවෙලින් කරනු ලැබූ ලෙස, පවරනු ලැබූ ලෙස හා පැන නැග ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

මුදල් නීති පනත යටතේ රක්ෂිත තැන්පතුවලට අදාල වත්කම් ඒ තැන්පතුවලට අදාල බැරකම් පියවීම සඳහා විනා ප්‍රයෝජනයට නොගත යුතු බව.

73. යම් වර්ෂයක බැංකු ව්‍යාපාරයක් පවත්වාගෙන යන යම් ලියාපදිංචි කළ සමිතියක් විසින් එහි තැන්පතු මුදල් නීති පනතේ V වැනි පරිච්ඡේදයේ II වැනි කොටස යටතේ රක්ෂණය කොට ඇති අවස්ථාවක ඒ කොටස යටතේ රක්ෂිත තැන්පතුවලට අදාල වත්කම්, මේ පනතේ අන් කිසි විධිවිධානයක කුමක් සඳහන්ව ඇත ද එය නොතකා ඒ තැන්පතුවලට අදාළ බැරකම් පියවීම නොවන වෙන යම් කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නො ගත යුතු ය.

ප්‍රඥප්තිය අනුව ක්‍රියා නොකිරීම සඳහා දණ්ඩනය.

74. (1) මේ ප්‍රඥප්තියේ කාර්යයන් සඳහා රෙජිස්ට්‍රාර් විසින් හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් යථා පරිදි බලය පවරනු ලැබූ අන් තැනැත්තකු විසින් නියම කරන ලද යම් ක්‍රියාවක් කිරීම හෝ යම් තොරතුරක් සැපයීම හිතාමතාම ම පැහැර හරින හෝ ප්‍රතික්ෂේප කරන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයෙකු, සහ මේ පනතේ විධි විධාන යටතේ නිකුත් කරන ලද යම් කැඳවීමේ නියෝගයකට නියමයකට හෝ නීත්‍යානුකූල ලිඛිත නියෝගයකට හිතාමතාම හෝ යම් සාධාරණ හේතුවක් නොමැතිව අකීකරු වන හෝ මේ පනතේ විධිවිධාන යටතේ යම් තොරතුරක් සපයන ලෙස නියම කිරීමට බලය පවරනු ලැබූ තැනැත්තෙකු විසින් එසේ සැපයීමට නීත්‍යානුකූලව නියම කරන ලද යම් තොරතුරක් සැපයීම පැහැර හරින සෑම තැනැත්තෙකු ම, සහ හිතාමතාම අසත්‍ය වාර්තාවක් ඉදිරිපත් කරන හෝ අසත්‍ය තොරතුරු සපයන සෑම ලියාපදිංචි කළ සමිතියක් හෝ එහි යම් නිලධරයෙකු හෝ සේවකයෙකු හෝ සාමාජිකයකු මේ ප්‍රඥප්තිය යටතේ වරදකට වරදකරු විය යුතුය.

(2) (1) වැනි උප වගන්තියේ සඳහන් යම් වරදක් කරන සෑම තැනැත්තකුම මහේස්ත්‍රාත්වරයෙකු ඉදිරියෙහි පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ රුපියල් දොලොස් දහසක් නොඉක්මවන දඩයකට හෝ බන්ධනාගාර ගත කිරීම හා දඩය යන දෙකටම හෝ ඒ දඬුවම මහේස්ත්‍රාත්වරයෙකුගේ සාමාන්‍ය අධිකරණ බලය ඉක්මවූව ද ඔහු යටත් විය යුතුය.

(3) ලියාපදිංචි කළ සමිතියක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක කරන ලද වරද යම් යුතුකමක් කඩකිරීමක් වේ ද ඒ යුතුකම ඉටු කිරීමට අතුරු ව්‍යවස්ථාවලින් හෝ රීතිවලින් බැඳී සිටින එම සමිතියේ සෑම නිලධරයෙකුම හෝ එබඳු නිලධරයෙක් නොසිටි නම් කාරක සභාවේ සෑම සාමාජිකයෙකුම ඒ සාමාජිකයා ඒ වරද කිරීම ගැන නොදැන සිටි බව හෝ එය වැලැක්වීමට ප්‍රයත්න දැරූ බව ඔප්පු කරනු ලැබුවහොත් මිස ඔහු විසින් ඒ වරද කරන ලද්දේ නම් ඔහු යටත් විය යුතු වන දණ්ඩනයටම යටත් විය යුතුය.

75. මේ ප්‍රඥප්තිය යටතේ ස්වකීය කාර්යයන් ඉටු කිරීමේ දී හෝ කර්තව්‍ය කිරීමේ දී සද්භාවයෙන් කරන ලද හෝ කරන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් රෙජිස්ට්‍රාර්වරයාට, නියෝජ්‍ය, ජ්‍යෙෂ්ඨ සහකාර, සහකාර කොමසාරිස්වරයන්ට මේ ප්‍රඥප්තියේ 44,46,47,49,52,66 සහ 67 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර්වරයා විසින් යථා පරිදි බලය දෙන ලද හෝ පත් කරන ලද වෙනත් තැනැත්තකුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතුය.

රෙජිස්ට්‍රාර්වරයාගේ ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

76. අමාත්‍යවරයා විසින් එක් එක් අවස්ථාවෙහි විශේෂ ආඥාවකින් හා ඔහු විසින් නියම කළ හැකි යම් කොන්දේසිවලට යටත්ව මේ ප්‍රඥප්තියේ වූ නියමයන්ගෙන් යම් නියමයකින් -

(අ) යම් සමිති සංඛ්‍යාක් ;

(ආ) යම් සමිතියක්, නිදහස් කළ හැකිය.

77. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි "අතුරුව්‍යවස්ථා" යන්නෙන් තත් කාලයෙහි බලපවත්නා ලියාපදිංචි කළ අතුරු ව්‍යවස්ථා අදහස් වන අතර එම අතුරුව්‍යවස්ථාවල ලියාපදිංචි කළ සංශෝධනය ද ඇතුළත් වේ.

අර්ථ නිරූපණය.

"කාරක සභාව" යන්නෙන් ලියාපදිංචි කළ සමිතියක කටයුතු පිළිබඳ කළමනාකාරිත්වය භාර ගනු ලැබූ ඒ සමිතියේ පාලක මණ්ඩලය අදහස් වන අතර ලියාපදිංචි කළ සමිතියක අධ්‍යක්ෂ මණ්ඩලය හා 48 වැනි වගන්තිය යටතේ රෙජිස්ට්‍රාර් විසින් පත්කරන ලද තැනැත්තෝද ඊට ඇතුළත් වෙති.

"නිලධරයා" යන්නට සමිතියක හෝ එහි යම් ශාඛාවක සභාපතිවරයා, උප සභාපතිවරයා, ලේකම්වරයා, භාණ්ඩාගාරික හෝ කළමණාකාරවරයා හෝ සමිතියක කාරක සභාවක සාමාජිකයෙකු හෝ සමිතියේ කටයුතු සම්බන්ධයෙන් විධාන දීමට යථා පරිදි බලය දෙනු ලැබූ වෙනත් තැනැත්තෙකු ඇතුළත් වේ.

"බැංකුව" යන්නෙන් –

(අ) මහජනයාගෙන් ඉල්ලුම් තැන්පත් මුදල් භාරගැනීමේ හෝ ඉල්ලුම් තැන්පත් මුදල් ඇතිකිරීමේ ව්‍යාපාරය ශ්‍රී ලංකාව තුළ කරගෙන යන නීතිගත කරනු ලැබූ හෝ නීතිගත කරනු නොලැබූ යම් පුද්ගලයෙක් හෝ පුද්ගල මණ්ඩලයක් ;

(ආ) ආණ්ඩුව වෙනුවෙන් ක්‍රියා කරන්නා වූ හා ණය දීම, අත්තිකාරම් දීම හෝ ආයෝජනය කිරීම කරන්නා වූ හෝ මහජනයාගෙන් මුදල් තැන්පතු භාරගන්නා වූ (යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් ආකාරයකින් පිහිටුවනු ලැබූ) යම් නියෝජිත ආයතනයක් හෝ ආයතනයන් ;

(ඇ) ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ලංකාවේ සංවර්ධන මුදල් සංස්ථාව ; හා

(ඈ) සමුපකාර සංවර්ධන විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විමසා මුදල් විෂය භාර කැබිනට් අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පලකරනු ලැබූ ආඥාවක් මගින් මේ පනතේ කාර්යයන් සඳහා බැංකුවක් ලෙස ප්‍රකාශිත අන්තිසි පුද්ගලයෙකු හෝ පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

"මූලික සමිතිය" යන්නෙන් 3(1) වන වගන්තියේ (ආ), (ඇ) හා (ඈ) ඡේදවල සඳහන් යම් අරමුණක් ඇතිව හෝ යම් කාර්යයක් සඳහා පිහිටුවන යම් සමිතියක් නොවන ලියාපදිංචි කළ සමිතියක් අදහස් වේ.

"රීති" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ පනවනු ලැබූ හෝ පනවනු ලැබූ ලෙස සලකන රීති අදහස් වේ.

"රෙජිස්ට්‍රාර්" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ මධ්‍යම පළාතේ පළාත් සභාවේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්කෙනෙකුගේ ප්‍රහුකම් ඉටු කිරීම සඳහා පත් කරන ලද තැනැත්තෙක් අදහස් වේ.

"ලියාපදිංචි කළ සමිතිය" යන්නෙන් මේ ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබූ හෝ ලියාපදිංචි කරනු ලැබූ ලෙස සැලකෙන සමිතියක් අදහස් වේ.

"සාමාජිකයා" යන්නට සමිතියක් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම් කිරීමට සහභාගී වන තැනැත්තෙක් ද, ලියාපදිංචි කරනු ලැබීමෙන් පසු රීති හා අතුරු ව්‍යවස්ථා අනුව සාමාජිකත්වයට ඇතුළත් කරගන්නා ලද තැනැත්තෙක් ද ඇතුළත් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් මේ පනත යටතේ මධ්‍යම පළාතේ සමුපකාර සංවර්ධන විෂය භාර ඇමතිවරයාගේ ප්‍රහුකම් ඉටුකිරීම සඳහා පත්කරන ලද තැනැත්තෙක් අදහස් කෙරේ.

01–393

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.